# 2022 සැප්තැම්බර් මස 01 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. ඩබ්. එම්. නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ලලිත් ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්. බී. නිලංක සිල්වා මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කේ. පී. සුසන්ත පෙරේරා මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කුමාර රාජරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උජිත් ක්‍රිශාන්ත කල්දේරා මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. දිපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණි පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්. එම්. ඒ. දෝන දිලාශිනී මහත්මිය |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |

41. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
42. මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
43. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
44. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
45. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2022.09.01 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනීම හා සළකා බැලීම.</u>

2022.08.12 දින පැවති මහා සභා වාර්තාව සලකා බැලීම.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මාසික සභා වාර්තාව ඔබතුමාගේ නිර්වචනය අනුව ජන්ද විමසීමක් කරන්න බැහැ. මාසික සභා රැස්වීම් වාර්තාව ගැන කතා කරන එකවත් හරියට සටහන් වෙයි කියලා බලාපොරොත්තුව තියෙනවා. මම යෝජනාව කරනවා ඔබතුමාට වේලාවක් අරගෙන මේ වාර්තාව උඩ ඉදලා පල්ලෙහාට කියවලා බලන්න මෙහි මොනවාද ලියලා තියෙන්නේ කියලා. මේ වාර්තාව කාගේ අවශ්‍යතාවයකට හැදෙනවාද කියලා අපිට ප්‍රශ්නයක්. අපි කියන දේ නෙවෙයි වාර්තාවේ තියෙන්නේ, වාර්තාවල තියෙන්නේ එක එක පුද්ගලයන්ට අවශ්‍ය දේවල්. මෙහි ඡේදයක් කියවනකොට පිස්සු හැදෙනවා. සිංහල භාෂාව නෙමෙයි මෙහි තියෙන්නේ. ඒ නිසා මේවාට ජන්ද විමසීම් අපිට අවශ්‍ය නැහැ. අපි ඔබතුමාට අවධාරණය කරනවා වාර්තාව හරියට කරන්න. කරුණාකරලා වැඩබලන ලේකම්තුමාට උපදෙස් දෙන්න කියලා. වාර්තාව හරියට හැදුවේ නැත්නම් ඉස්සරහට ප්‍රශ්න ඇති වෙනවා. වාර්තාවේ වැරදි එකින් එක පෙන්නන්න බැහැ. ඔබතුමා වාර්තාව කියවලා බලන්න කියලා ඉල්ලීම් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. පිලිප් ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2022.08.12 සභා වාර්තාවේ 22 පිටුවේ 03(15) යටතේ මගේ නම සඳහන් වියයුතු බැවින්, ඒ නම සංශෝධනය වෙන්න ඕනෑ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2022.08.12 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව මා ඉදිරිපත් කර සිටිනවා.

එම යෝජනාව මහා නගර සභා මන්ත්‍රී එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

2022.08.12 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සම්මත විය.

## 02 <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන</u>

**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

02(01) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ආර්. ක්‍රිෂනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය පෞද්ගලික කාරණාවක් හේතු කොටගෙන අද දින සභාවට ඒමට නොහැකි බව දන්වා එවා තිබෙනවා.

02(02) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, එම්. නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය කෙටි පණිවිඩයක් මඟින් අද දිනයේ සහභාගිවීමට නොහැකි බව දැනුම් දුන්නා.

02(03) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ගරු ඩී. ඩබ්. ඒ. රන්දූ නිරෝෂණ මන්ත්‍රීතුමා කෙටි පණිවිඩයක් මඟින් අද දිනයේ සහභාගිවීමට නොහැකි බව දැනුම් දුන්නා.

## 03 සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

### 03(1) මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, කටුබැද්ද නාගරික වෙළඳපොලේ කඩ කාමර 23 ක් පමණක් බෙදාදෙන්න ඔබතුමා තීරණය කරලා තියෙනවා. මෙය ඇත්තක්ද මේ අයට විතරද ලබාගන්නේ කියලා පැහැදිලි කරගන්න ඕනෑ. මෙතන කඩ කාමර 41 ක් පවත්වාගෙන ගියා. නමුත්, තාවකාලිකව ලබාදුන්න කඩවලට සමහර අයට එන්න හැකියාවක් තිබුණේ නැහැ. විශේෂයෙන් ගත්තම නගර සභාවේ නාගරික වෙළඳපොලේ පාවහන් අලෙවි කරපු මධ්‍යස්ථානයේ මෙතනට ඇවිල්ලා පොඩි කඩකාමරයක හිරවෙලා මෙය කරගන්න බැහැ. නාගරික සංවර්ධන අධිකාරියේ ලැයිස්තුවේ නම් 41 ක් තියනවා. අතපත්තු හා ගෝමස් යන දෙදෙනා පෙත්සම් 02 ක් දීලා තියනවා. මේ අය කටුබැද්ද නාගරික වෙළඳපොල ඉදිකරන්න අවුරුදු 13 කට පෙර කටුබැද්ද ආධුනිකත්ව මණ්ඩලය තියන ස්ථානයේ කඩ කරපු උදවිය. ඒ අයට කඩ ලබාදිය යුතුම නිසා ඒ අයව නිර්දේශ කරා කටුබැද්ද මාකර්ට් එකෙන් කඩ කාමර ලබාදෙන්න කියලා. ඒ අයගේ නම් ඒ ලැයිස්තුවේ නැහැ. මෙය අසාධාරණයි. මේ 41දෙනා කඩකාමර වලට බදු ගෙවපු උදවිය. ඒ අයට නොදුන්නොත් අපිට නඩු දාන්න යනවා. නඩු කියන්න නගර සභාවේ මුදල් යනවා. මේ අය බදු ගිවිසුමට යටත්ව කඩ කරපු අය. මේ 41 දෙනාට කඩ ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

### 03(2) මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, මොරටුවේ නව ගාලුපාරේ දුම්රියපොළට ටිකක් මෙහායින් ඇතුළට තියෙන පාරේ සති ගානක් තිස්සේ කුණු ගොඩගැහිලා. ඒ පාරේ යන්න ඉඩ නැහැ. ඒ පාරේ කඩවල් තියෙනවා. ඒ පාරෙන් ප්‍රධාන පාසල් වලට ළමයින් යනවා. ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඉක්මණින් මේ පාරේ කුණු සුද්ද කරල දෙන්න කියලා.

### 03(3) මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, පසුගිය සභාවේ පර්චස් 3.2 ක ලක්ෂපතියේ ප්‍රකාශන ඔප්පුවක් සම්බන්ධ කතා කළා. යම්කිසි කෙනෙක් වැරදි සහගත ක්‍රියාවක් කරලා තියෙනවා නම්, ප්‍රකාශන ඔප්පුවක් හදලා තියෙනවා නම් කඩිනමින් නීත්‍යානුකූලව පියවර ගන්න. වැරදිකාරයන්ට දඬුවම් දෙන්න. අනවසර ගොඩනැගිල්ලක් නම් ඒක ඉවත් කරන්න. මේ ඉඩම නගර සභාවට පවරගන්නවා නම් අපි විරුද්ධ වෙන්නේ නැහැ.

### 03(4) මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, ලුනාව ඇවිදින මංතීරුව හදලා තියෙන්නේ ඉඩම් පවරාගෙන. ඇවිදින මංතීරුවට මාර්ග අයිතියක් කාටවත් දෙන්න බැහැ. ඒ වුනාට ගෙවල්වල ගේට්ටු දාලා මාර්ග අයිතිය ගත්ත මන්ත්‍රීවරු ඉන්නවා. ඉන්පසු තවත් මිනිසුන් මාර්ග අයිතිය අරගෙන තියනවා. එහෙම කරන්න බැහැ. එය නීති විරෝධියි. මේ සම්බන්ධව හොයලා බලලා කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, කටුබැද්ද නාගරික වෙළඳ පොලේ කඩකාමර සම්බන්ධ කටයුත්තට මම දායකවුණේ මොන ආකාරයෙන්ද කියලා සජිත් දුමින්ද මන්ත්‍රීතුමා ඉතා හොඳින් දන්නවා. ඒකට හේතුව තමයි මොරටුව මහා නගර සභාවට අයත් වන්නාවූ සමහර අය විසින් සමන්ලාල්ගේ බූදලයක් ලෙස සලකලා කටයුතු කරනවායි කියන ස්ටේඩියම් එකේ තියෙන්නාවූ කොන්දේසි උල්ලංඝනය වෙනවා කියලා පවසන අය විසින් අපි එන්නට පෙර සංක්‍රාන්ති සමයක අවුරුද්දයි මාස අටක කාලයකදී කොමසාරිස්තුමා විසින් කාර් පාර්ක් එක යූ. ඩී එකට අත්පත් කරදීම තුළ කරපු සංවර්ධනයේදි අපි එන්නටත් පෙර 2018 මේගොල්ලෝ හැදුවා. මේ සම්බන්ධයෙන් වෙන්නාවූ කාරණයේදී මෙය කැඩීමටත් පෙර තාවකාලික කඩත් හදලා තිබුණේ. බෙලෙක් කඩේ ඒ නගර සභාවෙන් කරන්නේ නැති කාර්යය මාස තුනක් කල් ඉල්ලනකොට දින තුනක් දීලා ගොඩනැගිල්ලත් කඩලා, බඩු ටිකත් ඇදලා, කඩවලටත් දැම්මා මේ ඔක්කොම ලේඛන හදලා තිබුණෙත් මම නෙමෙයි තාවකාලික කඩ හැදුවේ මම නොවේ. මේ ඔක්කොම කරලා තිබුණේ මම එනකොට. ලේඛණයක් හදාගෙන තිබුණා කාටද දෙන්නේ කියලා. ඔබතුමන්ලම දන්නවා සභාවේ දේපළ තුනක් අත්පත් කරගෙන තිබුණා. ලෝහ නැතුව තුනම දීලා තිබුණා. අත්පත් කරගැනීම කරන්න ඕනෑ සංවර්ධනයකට, නමුත් කරලා තිබුනේ යූ. ඩී. එකට අත්පත් කරදීමයි. මම කිව්වා යම්දෙයකට අත්පත් කරගැනීමක් කරන්න පුළුවන් වෙන්නේ වෙනත් කාර්යයකට නම් ඒ කාර්යය ඊට වඩා යහපත් වෙන කාර්යයක් වෙන්න ඕනෑ. යූ. ඩී. එක අත්පත් කරගෙන මම කිව්වා මට කරුණාකරලා මෙහි වැඩකටයුතු ආරම්භ කරන්නට පෙර පාර්ක් එකෙයි පොළෙයි. නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා විමසීමක් කරා. මෙය හැදුවාට පසු මෙහි අයිතිය කාටද දෙන්නේ කියලා. මම එයට පිළිතුරක් දුන්නා, මේ සම්බන්ධයෙන් අපිට මෙය සංවර්ධනය කරල දෙනවා කියලා ලියුම අපි අතට ගත්තට පස්සේ තමයි අවසර දුන්නේ. එහෙම අවසරය ගත්තට පස්සේ ලේඛනයක් තියෙනවා. මධ්‍යම වෙළඳපොලේ ලේඛනයක් හැදුවා. ඒ ලේඛනයේ ඉන්නේ හතලිස්දෙනයි. ලේඛනයේ ඉන්නෙ හැබැයි අපි ඒක හදන්න ගියාම අනුව දක්වා වර්ධනය වුනා. විසිතුනක ලේඛනයක් යූ.ඩී. එකෙන් හදලා තිබුණා. ඔය කියන නෝනා ඊයේ මාව හම්බවෙන්න ආවා. වැරැද්දක් වෙලා තියෙන්නේ. වරද නිවැරදි කරන්න ඕනෑ. ආධුනිකත්ව මණ්ඩලයේ ගාව ඉඳලා ආවා ඔප්පුව තිබුණා. තාත්තාගෙන් මාග්‍රට් කියන අම්මට ගිය ගිවිසුම තිබුණා මාග්‍රට්ගෙන් දුවට ආපු ගිවිසුම තිබුණා. මම ගිවිසුම් තුනත් කියෙව්වා. මම ඒ වෙලාවේම කොමසාරිස්තුමාවයි, ගණකාධිකාරීතුමාවයි ගෙනල්ලා කිව්වා මේ වැරැද්ද නිවැරදි කරන්න කියලා. මේ අයට කඩ දෙන්න ඕනෑ. එවකට දිසා ලේකම් ඉන්න කාලේ රුපියල් තිස්පන්දාහකට සල්ලි ගෙවලා ගත්ත ඉඩමක් ඔය පොළේ ඉඩම. මේ කාර්යයන් මා දැනගත්තේ යූ.ඩී. එක මෙය අත්පත් කරගෙන අපිට නොදෙයි කියලා බයක් මට හිතුනා. ඒක නිසා මම ලියුම ගත්තා. සංවර්ධනය කරාට පස්සේ අපිට දෙනවා කියලා මම ලියුමකින් ගත්තා. පායලී චම්පික ඇමතිතුමත් එක්ක මම ගියා මුල්ගල තියන්න. එතකොට සංවර්ධනය කරලා ඉවරයි.

ගරු මන්ත්‍රීවරුනි, ලුනාව කලපුව ඇවිදින මංතීරුව ආශ්‍රිතව පිරිසගේ ඉල්ලීම මත ඔවුන්ටත් ඇවිදීම සඳහා භාවිතා කිරීමට අඩි දෙකක හෝ තුනක ඇතුල්වීම ඒ සඳහා ඒ අවස්ථාව දෙන්න කිව්වම අපි යූ.ඩී. එකට දාලා අපි ඒ අවස්ථාව දුන්නා. හැබැයි සුරංග මන්ත්‍රීතුමා ගේට්ටුවක් දාලා තියෙනවා. අගලකඩ හාමුදුරුවන්ටත් ගේට්ටුවක් තියෙනවා. අවුරුදු දහයටම මම ඒ ගේට්ටුවෙන් ඇතුල්වෙලා නැහැ. ලුනාව කලපුවේ පළමුවන ඉඩම සංවර්ධනයට පවරාගැනීම් නොකරපු ඉඩමක් නම් පර්චස් පහළොවක් තියෙන්න ඕනෑ. ඒවගේම අඩි දාහතකට වඩා උඩ යන්න බැහැ. අඩි අසුවෙන් පස්සෙ දාහතක් උඩයන්න ඕනෑ කියලා නීති දාලා තියෙනවා. ඔබතුමාගේ ගෙදර ඒ නීති වලට ඇතුලත්කරලා නැති නිසා ඔබතුමාට හදන්න පුළුවන්කම ලැබිලා තියෙනවා. ලුනාව කලපුවේ එහෙම බැහැ. තිබුණු ගෙවල් ඒ විදියට පුළුවන් අලුතෙන්

හදනවා නම් එහෙම බැහැ. පර්චස් හතලිහකට වැඩි වර්ග අඩි හාරදාහට වැඩි වුණාම යූ.ඩී. එකට ගිහිල්ලා ඒක දුන්නා. දුන්න විදිය අපිට අදාල නැහැ. එතුමාගෙ මෙහෙට දාපු ප්ලෑන් එක තවම අනුමත කරලා නැහැ අපිට බැරි නිසා. එහෙන් පුළුවන් නිසා එතුමා එහෙන් කළා. නමුත්, යූ.ඩී. එක ඔබතුමාගේ ඒකට කොන්දේසියක් පනවල නැහැ. ඔබතුමා ඉන්නෙ පාරේ ගැට්ටෙ ඔබතුමාට කොන්දේසියක් දාලා නැහැ. එය අපිට ගැටළුවක් නැහැ. ගේට්ටුවක් තිබීම කියන එකෙන් අදහස් වෙන්නේ නැහැ. එය ඔහු පරිහරණය කරනවාද නැද්ද කියන එක. වැටක් බැදගෙන වැට ගලවල පරිහරණය කරනවානම් අපිට කියන්න පුළුවන් එය වහන්න කියලා. මට සුරංග මන්ත්‍රීතුමාගෙන්ම පටන්ගන්න පුළුවන් ගේට්ටුව වහන්න කියලා. හැබැයි ඒක ඉවර වෙන්නේ කාගෙන්ද කියලා අවබෝධයක් ගන්න වෙනවා. තව ගේට්ටු ගොඩාක් වහන්න වෙයි මට ප්‍රශ්නයක් නැහැ. මම ඒක කරන්නම්.

**03 (05)** <u>මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. සුරංග අපෝන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සභාවෙන් ගන්නා යම් තීරණයක් තියනවා නම් මගේ ගේට්ටු මම වහන්න එකඟයි. පූජ්‍ය අගලකඩ හාමුදුරුවන්ටත්, සියලු දෙනාටත් ඒක ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මන්ත්‍රීවරයෙක් වශයෙන් මම ආදර්ශමත් වෙන්න ඕනෑ. මගේ ගේට්ටුව වැසීමට හෙටම කටයුතු කරනවා.

ලක්ෂපතිය බල ප්‍රදේශයේ අර්නස්ට් පෙදෙස අනවසර ඉදිකිරීමක් සම්බන්ධයෙන් බී2ඒටී494/2009 මෙහි ව්‍යාජ ඔප්පුවක් සකස් කර ඔප්පුව දෙල්කඳ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි නොකල ඔප්පුවක් වශයෙන් මෙය භාවිතා කරනවා. මෙහි ඒටී එකේ සැලසුම් අංකය 1323 .2006.06.01 සර්වේ මහතෙකු තමන්ගේ ගෙදර ඉදගෙන සැලසුම් කරපු පර්චස් තුනකට සැලසුම් කරපු ප්ලෑන් එකක් හර්ෂ කුලරත්න නැමති සර්වේ තමයි මෙය සකස් කරලා තියෙන්නේ. මේ සැලසුමට කිසිදු පිඹුරුපතක් පාදක කරගෙන නැහැ. මෙම ව්‍යාජ ඒටී එක සකස් කරලා තියෙන්නේ විශ්‍රාම ගත්ත ආර්.අයි. මහත්තයෙක්. ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධයෙන් කඩිනමින් පියවරක් ගන්න. ඔහු වැරැද්දක් කරලා තියෙන්නේ ඔහුගේ විශ්‍රාම වැටුප තහනම් කරන්න පුළුවන්.

ගරු නගරාධිපතිතුමනි, පසුගිය සභාවේ සේනක දමයන්ත සිල්වා මැතිතුමා මගේ නම ප්‍රකාශ කළා මම ප්‍රකාශන ඔප්පුවක් සකස් කරලා තියෙනවා කියලා. ගරු නගරාධිපතිතුමනි, මොරටුව අධිකරණයේ බුදල් නියෝගයක් ලබාදීලා තියෙනවා. ගරු නීතීඥ අනුෂ ගුණසේකර මැතිතුමා මගේ සහෝදරයන් දෙදෙනාත් සමග දෙමාපියන්ගෙන් ආපු බුදල් නියෝගයක් සමඟ මට පරිත්‍යාග කරපු ඔප්පුව ඉදිරිපත් කරනවා. ඒවගේම පලමු පංතියේ බිම් සවිය සැලැස්ම ඉදිරිපත් කරලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, ගරු කොමසාරිස්තුමනි, මෙතුමා මගේ නම සඳහන් කරලා තියෙනවා ප්‍රකාශන ඔප්පුවක් හදලා තියෙනවා කියලා. එම කොටස කොමසාරිස්තුමා සහතික පතක් වශයෙන් සහතික කරලා දෙන්න. අධිකරණයට ඉදිරිපත් කිරීමට මම කටයුතු කරනවා. ගරු නගරාධිපතිතුමනි, මේ ඉදිරිපත් කරපු සියලුමදේට කඩිනමින් පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ. දෙල්කඳ නුගේගොඩ රෙජිස්ට්‍රාර් ජෙනරාල්තුමා නිකුත් කරලා තියෙන පිඹුරුපතේ ඒ සම්බන්ධව මම ඉදිරිපත් කරලා තියෙනවා කරුණු ඒ සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂණයක් ඉදිරිපත් වියයුතුයි. මේ සභාවේ මෙවැනි දේවල් ඉටු නොවෙනවා නෙවෙයි. තමන්ගේ අක්කාගේ දුවට හොර සීල් ගහලා ප්ලෑන් පාස්කරන මහත්වරුත් ඉන්නවා මේ සභාවේ. තමන්ගේ පාක්ෂිකයන්, තමන්ගේ ඥාතීන්ට නීතිය එක සේ ක්‍රියාත්මක කරන්න. සභාවේ නීති නිලධාරී ඉන්නවා. අදාල ඒටී එක සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරන්න කියමින් මම නිහඬ වෙනවා.

**03(06)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සොයිසාපුර ප්‍රදේශයේ දිරන කසළ, ඉඳුල් දවස් දෙකක් රැගෙන යන නිසා එම කාර්යය මේ වෙනකොට ඉටුවෙන නිසා ඒ පිළිබඳ සතුටු වෙනවා. පොලිතින් සහ ප්ලාස්ටික් මේ වෙනකොට තැන් තැන් වල ගොඩගැහෙමින් පවතිනවා. සොයිසාපුර ප්ලාස්ටික්, පොලිතින් එකතු කරන්නේ මාසයකට එක දවසයි. ඩෙංගු හැමතැනම ව්‍යාප්ත වෙනවා. ඒ නිසා සතියකට දවසක් පොලිතින්, ප්ලාස්ටික් ගෙනියනවා නම් හොදයි. සභාව මඟින් පහුගිය සති කිහිපය තුළ අනවසර පදික වෙළෙඳුන්ව ඉවත් කිරීමක් කරගෙන යනවා. කාලයක් තිස්සේ පවත්වාගෙන ආපු ඉදිකිරීමුත් තියෙනවා. ජංගම වෙළෙඳසැලුත් තියෙනවා. දැන් තියෙන ආර්ථික අර්බුදය සහ විශාල පීඩාවකින් ජනතාව සිටින කාලයේ ඉතාම අමාරුවෙන් තමන් කරගෙන යන කුඩා ව්‍යාපාරට අනවසර වෙන්න පුළුවන් තමන්ගේ ජීවිකාව කරගෙන යන අවස්ථාවකදී එකපාරටම ඇවිල්ලා සභාවෙන් මේ ස්ථාන ඉවත් කරාට පස්සේ ඒ ජනතාව අතිවිශාල අපහසුතාවයකට පත්වෙනවා. ලුනාව කලපුව අසල අවුරුදු හතක් තිස්සේ හිටපු සව්,

කොළ කැද විකුණපු මහතුන් දෙපල එක මොහොතකින් ඉවත් කරනවා. අපිට සැකයකුත් එනවා. නිලධාරීන් අනවසර කඩ ඉවත් කරලා නිලධාරීන්ම කියනවා නගරාධිපතිතුමාව හම්බවෙන්න කියලා. එතකොට මොනවා හරි කරගන්න පුළුවන් කියලා. මේ ක්‍රියාවලිය මොකක්ද කියන එකත් අපිට ප්‍රශ්නයක්. ඔබතුමා හිතාමතාම කරනවද කියලා අපි දන්නේ නැහැ. අපිට පොඩි සැකයකුත් එනවා. ඔබතුමාගේ බිදවැටිච්ච ප්‍රතිරූපය නැවත ගොඩනගාගන්න පොඩි උපක්‍රමයක් තෝරා ගන්නවාද කියන සැයකුත් අපිට එනවා. ජනතාවත් ඉතාම අමාරුවෙන් තමයි මේ කටයුත්ත කරන්නේ. ඒක නිසා විධිමත් ක්‍රියාවලියක් ඒ අයටත් යම් සාධාරණයක් වෙන විදියට සභාවක් මැදිහත්වෙලා සම්බන්ධීකරණයක් ඇතුලේ මට දැනගන්න ලැබුනා එහෙම ක්‍රියාවලියක් ආරම්භ කරලා තියෙනවා කියලා. කිසියම් ආකාරයකට ඒ අයට මේ කටයුත්ත කරගෙන යන්න අවස්ථාවක් සාධාරණ විදියට හදලා දෙන්න කියන ඉල්ලීම තියෙනවා. එකපාරටම ඉවත් කරන්නේ නැතුව ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා ජනතාව වෙනුවෙන්.

<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු සුදේශ් මන්ත්‍රීතුමා, විශේෂයෙන්ම මම දකින දේ තමයි නිශාන්ත මන්ත්‍රීතුමත් මේ පිළිබඳව අවධානය ගන්න ඕනෑ. ඔබතුමා සභාවේ මේ පිළිබඳ කතා කරනවා. ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා සභාවේදි නෙමෙයි මෙය කතා කරන්නේ. එදා මෙතුමා ලියමුක් ලියනවා මටත් ලියලා එහි පිටපත කොමසාරිස්තුමාටත්. ඔබතුමා කියපු ඔක්කොම කාරණා ඒ ලියුමේ තියෙනවා. ඕනෑනම් දැනගැනීම සඳහා යොමු කරන්නම් සභාවට. එතුමා කියනවා මේ අවස්ථාවේදී මෙය කරන්න එපා මෙයට වැඩසටහනක් හදන්න. එතුමා කියනවා මෙය තමයි අපි ඔබතුමන්ලා ඔක්කෝමලාගෙන් බලාපොරොත්තු වෙන්නේ. මේ ප්‍රශ්නෙදි සභා දවසක් කියන එක වෙනකන් ඉන්න ඕනෑ නැහැ. ඔබතුමා කියනවා මෙයට මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගත්තා කියලා. ඒ ක්‍රියාමාර්ගය ගත්තේ ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමාගේ මැදිහත්වීම තුළ. එතුමා කියනවා මෙයට ක්‍රියාමාර්ගයක් ගන්න මේ වෙලාව හොඳ නැහැ. ඒ ගත්තේ නිකම්ම නිකන් සමන්ලාල්ට හිතිලා නෙමෙයි. නිලධාරීන්ට හිතිලා නෙමෙයි. මම බලාපොරොත්තු වෙනවා ඔබතුමන්ලාගෙන්. ඒ දේ මට ලියන්න ඕනෑ නැහැ. කොමසාරිස්තුමාට ලිව්වානම් මෙහෙම කරන්න කියලා ඒක වැදගත්. මන්ත්‍රීවරුන්ව පත්කරලා තියෙන්නේ මාසෙකට පාරක් තියෙන සභාවකට විතරක් වග කියන්න නෙමෙයි. තුන්සියහැටපස් දවසේම ජනතාවගේ දේවල් වලට වගකියන්න අපිව පත්කරලා තියෙන්නේ. ඒ වගකීම ගන්න. එතකොට සභාව දවසේම නෙමෙයි අනෙක් වේලාවල් වලටත් ලියන්න පුළුවන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සමාවෙන්න. මම ඔබතුමා එක්ක තර්ක කරන්නේ නැහැ. ඔය සිද්ධිය මගේ කණට මුලින්ම වැටුණු දවසේ මම කොමසාරිස්තුමාව මුණගැසුණා. එතුමට මේ පිළිබඳ සඳහනක් කරලා එතුමගෙන් කරුණු විමසලා තමයි සභාවේ අද මේ ප්‍රකාශය කරන්නේ.

(මෙම අවස්ථාවේදී මහා නගර සභා මන්ත්‍රී යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා සභා ගැබෙන් පිටව ගියහ.)

03(07) <u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කසල වත්තට යන මාර්ගය සෑහෙන අබලන් තත්ත්වයෙ තියෙන්නේ අදාල ව්‍යාපෘතියත් එක්ක හරි කැස්බෑව නගර සභාවත් එක්ක හරි කතා කරලා මෙය සාකච්ඡා කරලා පාර හදාගන්න පුළුවන්නම් එම පාරේ යන වාහන වලට වන ඩැමේජ් එක අඩු කරගන්න පුළුවන්. මේ දවස්වල වැසි කාලෙත් එක්ක විශේෂයෙන් අබලන් වෙලා තියෙන ගොඩනැගිලි කිහිපයක් තියෙනවා. (මෝදර ප්‍රජාශාලාව) නිලධාරීන් යොදවලා අබලන් වෙලා තියෙන ගොඩනැගිලි පිළිබඳව සැලකිලිමත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා. මේවා සාකච්ඡා කරනවා. ගොඩනැගිලිවල ගරාවැටීම් පිළිබඳ පරීක්ෂණය කරන කමිටුවල වාර්තාත් තියෙනවා. ඒවා අවසාන වෙන්න ඉස්සෙල්ලා ගොඩනැගිලි කඩාගෙන වැටෙන්න පුළුවන්. අබලන් තත්ත්වයේ තියෙන ඒවා නිසා කර්මාන්ත අංශයට යොමු කරලා බලන්න කියන ඉල්ලීම කරනවා.

03(08) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පැමිණිලි හා පෙත්සම් යටතේ ප්‍රධාන කරුණු කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා පළවෙනි එක මටත් කියන්න තියෙනවා ලියුම සම්බන්ධයෙන් කථාව. ඔබතුමා ඔක්කෝම මන්ත්‍රීවරුන්ටනේ කිවුවේ, එක්කෙනෙක් දෙන්නෙක්ට නෙවෙයිනේ, අනේ මට මේ හිතුනා සමන්ලාල් ද කතා කරන්නේ කියලා, සමන්ලාල් ප්‍රනාන්දු මෙතන ඉන්න කවුරු හරි විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ලියුමක් ලිව්වා නම් කොමසාරිස්තුමාට සමන්ලාල් ප්‍රනාන්දු ඒ ලියුම ක්‍රියාත්මක කෙරුවොත් හෙට ඉර පායන්නේ බස්නාහිරින්. ඒ නිසා එහෙම ක්‍රියාත්මක කරන්නේ නැහැ සමන්ලාල් ප්‍රනාන්දු. අඩුම තරමේ විපක්ෂයේ ඕනෑ නැහැ ආණ්ඩු පක්ෂයේ කෙනෙක් ලිවුවත් කරන්නේ නැහැ. නගරාධිපතිතුමා ලියුම් ලියන්න ඕනෑ නැහැ මෙය කරන්න. මෙය අවුරුදු 17ක් ඔබතුමා පාලනය කරලා තියෙනවා. සමන්ලාල් කියන්නේ පොළව යටත් අඩි ගාණක් පේන මනුස්සයෙක්. ඒ නිසා සමන්ලාල් ප්‍රනාන්දුට පේමන්ට් අයින් කරන්න හොද නැහැ. දැන් මිනිසුන් ඉන්න ආර්ථික තත්ත්වය හොද නැහැ කියලා ලියුම් ලියන්න ඕනද ? ඒවා විහිලු කතා. ඒ නිසා ගරු නගරාධිපතිතුමා, නිකම් විහිලු සපයන්න එපා මෙතන මන්ත්‍රීවරුන්ට. මන්ත්‍රීවරු කියන ඒවා කරනවානම් අපි හෙට ඉඳලා දෙන්නම් ලියුම්. කරන්න. අපි බොහෝම කැමතියි ඒවා ක්‍රියාත්මක කරන නගරාධිපතිවරයෙක් ඉන්නවානම්. අපි ලියන්නම් ලියුම්. අඩුපාඩු පෙන්නනන්නම්. ඒවා ක්‍රියාත්මක කරන්න. විශේෂයෙන්ම කියන්න ඕනෑ අපි හැමදාම හුදකලා සටනක යෙදෙනවා. බොහෝම කණගාටුවෙන් මේ කතා කරන්නේ. වාර්තා වල තියෙන යම් යම් අයිතමයන් සම්බන්ධයෙන්, මේ මොරටුව මහා නගර සභාවට ගෙවන බදු මුදල් විනාශ කරන එක සම්බන්ධයෙන් අපි විවිධ අයිතමයන් යටතේ කතා කරනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමා, දැන් කතා කරලා ඇති වෙලා තියෙන්නේ. මොකද කථා කරලා වැඩක් නැහැ. ගිය සභාවකදී මම පැහැදිලිව කිව්වා නගරාධිපතිවරායට පෞද්ගලිකව තියන නඩු වලට නගර සභාවේ මුදල් පරිහරණය කරන්න බැහැ කියලා. හත්වලාමෙ එක සැරයක් අස්කර ගත්ත වාර්තාවක් අප්‍රේල් මාසයෙ අයින් කරගත්තා. ඒක ආපසු එනවා සභාවට සහා අනුමැතිය හම්බවුණාලු. ලක්ෂ විසිහතරක්ද ලක්ෂ විසි විසිහතක්ද ඉල්ලලා. ඉතින් මේවා අපි කතා කරත් නොකරත් මේ පැත්තේ කට්ටිය අත ඉස්සුවාම ඒක අනුමතයි. ඒක නිසා සභා වාර්තා වල කතා කරලා වැඩක් නැහැ. හැබැයි අපිට ආපසු කියන්න තියෙන්නේ ඔය අත් උස්සන හැමෝටම නැවත වරක් ගෙවන්න වෙනවා. නගරාධිපතිවරයාගේ අත්තනෝමතික ක්‍රියාකලාපයට යම් කිසි පරීක්ෂණයක් කරානම් ඒ පරීක්ෂණයෙන් නිදොස් වෙන එක සමන්ලාල් ප්‍රනාන්දුගේ වගකීමක්. ඒ නිසා ඒකෙන් නිදොස් වෙන්න එයා යම් යම් දේවල් කරනවා. නඩු කියනවා, නීතීඥවරු අල්ලනවා. මොනවාහරි දේවල් කරනවා එයා නිදොස් වෙන්න. නිදොස් වුණා කියලා පාඩුවක් වුනාද නැහැ. ආපහු සැරයක් පත්වුනා. ඒ නිදොස් වෙන්න ගත්ත ක්‍රියාමර්ග වලට සල්ලි ඉල්ලනවා සභාවෙන්, මේවා මොනවද කියලා හිතාගන්න බැහැ. කරන කළට පව් මිහිරිය මී සේ විදින කළට දුක් දැඩි වේ ගිනි සේ කියලා තියෙනවා. ඒ නිසා පරිස්සමෙන් ඔය පරිහරණය කරන ඒවා ගන්න. ඒවා ගන්න එකතමයි කියන්න තියෙන්නේ. ගරු නගරාධිපතිතුමා, මේ සභාව යන විදිය හොඳ නැහැ දැන්, සමන්ලාල් ප්‍රනාන්දු ගිය විදිය යම් ප්‍රමාණයක සාධනීය ලක්ෂණ තිබ්බා අපි දැක්කා. නමුත්, දැන් වියරුවෙන් යන්නේ, මෙහි චණ්ඩි ටිකක් ඇති කරලා තමන්ගේ හෙන්වයියෝ චණ්ඩි බවට පත්කරලා සමහර මන්ත්‍රීවරුන්ගේ මල්ලිලා චණ්ඩි කරලා සමහර මල්ලිලා අපි යනකොටත් සද්ද බද්ද දාන්න පටන් අරගෙන තියෙනවා. අපි ඒ සම්බන්ධයෙන් කොමසාරිස්තුමාට පැමිණිලි කළා, අන්න ක්‍රියාත්මක කරන්නකෝ. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ ඔබතුමා මේ සභාවේ අවුරුදු 17ක් නගරාධිපති නම් මම මෙහි අවුරුදු 8ක් උප නගරාධිපති සහ තව අවුරුදු 8ක් මන්ත්‍රී. ඒ නිසා උඩ බුරන බල්ලන්ට බය නැහැ, ඒක පැහැදිලිව කියන්න ඕනෑ. බල්ලෝ බැද ගත්තේ නැත්තම් බල්ලොන්ව බන්දවන්න අපි දන්නවා. ඒ නිසා කාටවත් බයේ නම් දේශපාලනය කරන්නේ නැහැ. තව මම දැක්ක දෙයක් තියෙනවා දෙපාර්ශවයේ මන්ත්‍රීවරු ඒ ඒ අයගේ වැරදි අඩුපාඩු හොයනවා, දැන් මෙහි මන්ත්‍රීවරු ඉන්නේ මොරටුවේ ජනතාවට සේවය කරන්න නෙවෙයි, නගරාධිපතිවරයාගේ අඩුපාඩු හොයන අයට විරුද්ධ වෙන්න, අපි මේ සභාවේ අවුරුදු 17ක් හිටියා. මේ වගේ පහත් තත්ත්වයට සභාව වැටෙනවා අපි දැක්කේ නැහැ. මොකද හේතුව මේවා ඉදිරියට ගියාම හොද නැහැ. ඒ නිසා දැන් වෙලා තියෙන්නේ නගරාධිපතිවරයා දැනගන්න ඕනෑ නායකයා විදියට නගර සභාව විසුරුවනකම් මෙහි නගරාධිපතිවරයාට වගකිමක් තියෙනවා. ඒ නිසා කරුණාකරලා මේ තත්ත්වය නිවැරදි වෙන්න ඕනෑ. අපි මේ බොන වතුර එකේ ඉදලා මේ AC, ලයිට් මේ සැම දේම මේ මොරටුවේ ජනතාවගේ සල්ලි. ඒ නිසා මේ මොරටුවේ ජනතාවට යම්කිසි වචනයකින් හෝ සේවයක් කරන්න. විපක්ෂයේ ඉන්න අපිට සේවා කරන්න බැහැ. ආණ්ඩු පක්ෂයේ සේවාව කරනවා නම් අපි අත් දෙකම උස්සලා සහයෝගය දෙනවා. හැබැයි, සේවාව කරනවා කියලා පෙන්නලා කරන්නේ විගඩම් නම්, අධමකම් නම් අපි ඒවාට අත උස්සන්නේ නැහැ, සහයෝගය දෙන්නේ නැහැ. ගරු නගරාධිපතිතුමා, අපි ඔබතුමාගෙන් බොහෝම ඕනෑකමින් ඉල්ලනවා මේ පළිගැනීම් නවත්තන්න, මේ යන ක්‍රමවේදය නවත්තන්න, මේ කරන නාස්තිය නවත්වන්න. මේ මුදල් නාස්තිය නවත්තන්න. අද නගර

සභාවේ වාර්තාවක මම දැක්කා නියෝජ්‍ය නාගරික කොමසාරිස්වරයාගේ බලතල විමධ්‍යගත කරලා. නියෝජ්‍ය නාගරික කොමසාරිස්ගේ බලතල විමධ්‍යගත කරන්නේ නගරාධිපතිවරයා එක්ක ඇති කරගත්ත ප්‍රශ්නයක් නිසා. නියෝජ්‍ය නාගරික කොමසාරිස්වරයා මාරුවීමක් ඉල්ලලා තිබුණා, ඒ මාරුවීම ඉල්ලලා තිබුණේ නගරාධිපතිවරයාගෙන් ජීවිතයට හානියක් වෙයි කියන භයට, ඒ භය පහව ගියාට පස්සේ නියෝජ්‍ය කොමසාරිස්වරයා මෙතන ඉන්න කැමැත්ත පළකරලා තිබුණා. නමුත් නගරාධිපතිවරයාට ඕනැ වුණා මෙයින් යවන්න, නගරාධිපතිතුමා දිගින් දිගටම බලපෑම් කරලා නිළධාරින්ට නිදහස් කරලා ලියුම යැවුවා. ගරු නගරාධිපතිතුමා, ඒ නිසා නියෝජ්‍ය නාගරික කොමසාරිස්වරයාගේ බලතල බෙදනවා අනිත් අයට, මේ සභාවේ නිලධාරින් කීදෙනෙක් ඉන්නවද දැන්, නාගරික කොමසාරිස්වරයා. නියෝජ්‍ය නාගරික කොමසාරිස් නැහැ, නාගරික ලේකම් නැහැ, නාගරික ගණකාධිකාරිවරු දෙන්නා ඉන්නවා. විදුලි අධිකාරි කෙනෙක් නැහැ, ගාරාජ් අධිකාරිවරයෙක් නැහැ, පරිපාලන නිලධාරින් කිහිපදෙනෙක් අඩුයි. එතකොට මෙහෙට නිලධාරින් එන්නේ නැහැ. ඒකට හේතුව මේ නගරාධිපතිවරයා එක්ක වැඩ කරන්න බැහැ කියලා සමස්ථ නිලධාරින් අතර මතයක් තියෙනවා. ඒක සනාථ වන කටයුතු දිගින් දිගටම සිද්ධ වෙනවා. ඒ නිසා නිලධාරින් එන්නේ නැහැ.

<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට බාධාවක් කරනවා නෙවෙයි. අර ජීවිතයට හානියක් වෙයි කියලා බයට යන්න හදපු කෙනා ආයේ ඉන්න හැදුවේ සමන්ලාල් දැන් මරන්නේ නෑ කියලාද.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, සමන්ලාල් මරයි කියලා යන්න හදපු කෙනා එයා ඉන්නවා කියලා තීන්දු කළේ එයාට යම් කිසි තහවුරුවක් ලැබුණා. එහෙම දෙයක් වෙන්නේ නැහැ. කවුරුහරි කියලා තියෙනවා ඒ කේන්තියට කැගහලා තියෙන්නේ එහෙම කරන්නේ නැහැ කියලා. ඒ නිසායි ඒ මනුස්සයා ඉන්න හැදුවේ,

සභා ඝෝෂා

සමන්ලාල් කියන්නේ කවුද කියන්න අපි දන්නවා. සමන්ලාල්ට එහෙම ලොකු දේවල් කරන්න පුළුවන්ද කියලා අපි දන්නවා. කට්ටිය ඉන්න වෙලාවට ඉන්න විදියයි, නැති වෙලාවට ඉන්න විදියයි අපි දන්නවා. ඒ නිසා සමන්ලාල් ප්‍රනාන්දුගේ චරිතය අවුරුදු 16ක් 17ක් අපි කියවලා තියෙනවා. ඒ නිසා අපිට ඒවා ආපසු අලුත් වෙන්න දෙයක් නැහැ. මේ සභා වාර්තාවල තියෙන ආයතන කමිටුවේ ඉඳලා ගත්තොත් එහෙම රැවෙනකම් කථාකරන්න පුළුවන්. ඒ නිසා මේ තුච්චකම් නවත්වන්න. මෙය පාලනය කරනකොට යම් විනයානුකූලභාවයකින් කරන්න. විශේෂයෙන් අපි ඉල්ලා සිටිනවා මුදල් සම්බන්ධයෙන් විනයක් තියාගන්න කියලා, වියදම් කරනකොට විනයානුකූල බවක් තියාගන්න. ඔය තමන්ගේ අම්මාගේ අප්පාගේ බූදලය නෙමෙයි මේ වියදම් කරන්නේ. වියදම් කරන්නේ මහජනතාවගේ මුදල්. ඒ නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා. මේවා ඉතින් අපි දන්නවා කලයක් අනෙක් පැත්තට හරවලා වතුර වක්කරනවා වගේ වැඩක් තමයි මේ කරන්නේ කියලා අපි දන්නවා. ඒ නිසා ඒවා ගැන කථා කරලා වැඩක් නැහැ. අපේ ඇගේ තියෙන ලේ කුපිත කරගන්න එක විතරයි වෙන්නේ. ඒ නිසා මේ දවස්වල ඊට වඩා හොඳයි මෛත්‍රි සහගත සිත්වලින් ඉන්නවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.

03(09) <u>මහා නගර සභා මන්ත්‍රී - ආර්. එම්. ඒ. දෝන දිලාශිනී මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මා විසින් සභාවාර කිහිපයකදි කරපු ඉල්ලීමක් නැවත මතක් කරනවා සොයිසාපුර පදිකයන්ගේ අයිතිවාසිකම් උල්ලංගණය වෙලා තියෙනවා, පදිකයන් ගමන් ගන්නේ මාර්ගයේ අනතුරු වැඩිවීම්, මංකොල්ලාකෑම් වැඩිවෙලා තියෙනවා. එය මට අවස්ථා කිහිපයකදීම කතා කළා පදික වේදිකාව වෙළඳුන් අත්පත් කරගෙන තියෙන නිසා මෙතනදි යමක් කිව යුතුයි නගරාධිපතිතුමනි, සොයිසාපුර කොට්ඨාසය ජයග්‍රහණය කරපු මන්ත්‍රීවරිය මමයි. එතකොට එතන බහුතරයගේ මතය මම දන්නවා. වෙළඳුන් සිටිය යුතුයි ඒත් ඒක පදිකයින්ට බාධාවක් නම්, එය අනවසරනම් ඒ සම්බන්ධව කටයුතු කිරීමේ වගකීම නගර සභාව සතුයි, එය ප්‍රමාද වීම ගැන ජනතාව නොවිමසිල්ලෙන් සිටිනවා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, නඩු වලින් මේ අනවසර ඉදිකිරීම් සම්බන්ධව තිරණ අවිල්ලා තියෙනවා. ඒ අයට තවකාලිකව හෝ තැනක් ලබා දීලා පදිකයින්ට ගමන් කරන්න ඉඩ ලබා දෙන්න කියලා යළිත් ඉල්ලා

සිටිනවා. ඒ වගේම තවත් ඉල්ලීමක් තියෙනවා ගරු නගරාධිපතිතුමනි, හොර කල්ලියක් සහ මැර කල්ලියක් සොයිසාපුර සැරිසරනවා, ඒ පිළිබඳව පොලීසිය අවධානය යොමු කරන්නේ නැහැ. ඒ හේතුවෙන් පහුගිය දවස් වල වෙළඳසැල් මංකොල්ලකෑම් සිදුවුණා. මේ දේවල් සිද්ධ වෙන්න හේතුව විදියට අපි හිතන්නේ, මේ පිටස්තර වෙළඳුන් ඇවිල්ලා මේ අයට තොරතුරු දෙනවා. එබැවින් නගරාධිපතිතුමනි, මේ සම්බන්ධවත් අවධානය යොමු කරන්න. පහුගිය කාලයේ අපි කොමසාරිස්තුමාව සහ ඔබතුමාව දැනුවත් කළා. සොයිසාපුර තිබෙන ජල ටැංකි දෙකෙන් එක ටැංකියක් අකර්මන්‍ය වෙලා. සොයිසපුරට ජල සැපයුම අත්හිටවුවොත් එක ජල ටැංකියක ඇති ජලය දින දෙකක් ප්‍රමාණවත් දැයි කියන එක අපිට දැනගන්නට අවශ්‍යයයි. පසුගිය කාලයේ කොන්ත්‍රාත්කරුවන් විසින් මාර්ග අබලන්කර කඩා බිඳදමලා. ප්‍රතිසංස්කරණය හේතුවෙන් දින දෙකක් පමණ ජනතාවට ජලය තිබුණේ නැහැ ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන්. ඊයේ රෑ ජලය කප්පාදුවක් සිදුවුණා. මම ඊයේ රෑ ගිහින් බලනකොට ටැංකියේ සේවකයන් එතන නැහැ. සොයිසාපුර පිටස්තර ගෙවල් වලටත් ජලය ලබාදෙන බවට ජනතාව පවසනවා. ගරු නගරාධිපතිතුමනි, සොයිසාපුර පදිකයන්ට අනතුරු සිදුවෙන්නේ නැතුව පාරේ ගමන් කිරිමට අවශ්‍ය පහසුකම් සපයන්න. අනවසර ඉදිකිරීම් සම්බන්ධව දැඩි තීන්දුවක් ගන්න. සොයිසාපුර මත්ද්‍රව්‍ය, සොරු සම්බන්ධයෙන් අපි කලිනුත් කතාකළා. අපිට කට්ටිය එතකොට හිනාවුණා. පොලිසිය නිද්‍රා සහගතව සිටීම, ජනතාවගෙ ආරක්ෂාවට දැඩි තර්ජනයක් ඇති වෙන බව නැවත සැරයක් මතක් කර සිටිනවා.

**03(10) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් යටතේ කතා කරන විට අද මේවෙනකොට මොරටුව වඩු කර්මාන්තයට අත්වෙලා තියන ඉරණම පිළිබඳව වචන කිහිපයක් තියනවා කතා කරන්න. මේ සම්බන්ධයෙන් මගේ වයසත් එක්ක මට අවුරුදු තිහක තිස්පහක මතකයක් තියනවා. ඒ වගේම තමයි ඉදිබැද්දේ ඉපදිලා ඉන්න කෙනෙක් හැටියට වඩු කර්මාන්තය කරන ජනතාවත් සමග කතා කරන විට ඒ අයගේ දැනගන්නට ලැබෙන තොරතුරු සමග අපි දන්න දේ තමයි දැව කදන් වල අධික ලෙස මිල ඉහල යෑම සම්බන්ධව. මීට පෙර අවුරුදු වලත් අපි වැඩකරන කාලෙත් දැව කදන් ඉහල යනකොට වර්ග අඩියකින් රුපියල් විසිපහක් පනහක් වැඩිම වුනොත් රුපියල් සියයක් තමයි අවුරුදු දෙකකට සැරයක් වැඩිවෙන්නේ. නගරාධිපතිතුමනි, 2021, 2022 වර්ෂ වෙනකොට අසීමිතව වැඩිවෙන අවස්ථා තියෙනවා. මීට පෙර වර්ෂ වල දැව කදන් වල මිල වැඩි වෙනකොට එහි විතරයි මිල වැඩි වුණේ. එයට සාපේක්ෂව අද වඩු කර්මාන්තය කරන්න අවශ්‍ය වන අනෙක් හැම අමුද්‍රව්‍යයක්ම මේ දැවත් එක්කම වැඩි වෙනවා. වඩුවන්ට දරාගන්න බැරි අවස්ථාවකට ඇවිල්ලා තියෙන්නේ. පවුල් සංස්ථාව අරගෙන යන්න බැරි තත්ත්වයට ඇවිල්ලා තියෙනවා. රැකියාව කරගන්න බැරි තත්ත්වයට ඇවිල්ලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, මේ ගැන අවධානය යොමු කරලා මේ ගැන දැනුවත් කරන්න පුළුවන් ඉහළ තැනට දැනුම්දීලා ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් නිලධාරීන් ගෙන්නලා සාකච්ඡා කරලා සහනයක් ලබාදෙන්න ඕනෑ. අමුද්‍රව්‍ය විකුණන කඩවල් පවා හිතුමනාපයට බඩු මිල ඉහළ දාලා. අල්මාරියක් හදන්න ගියාම අමුද්‍රව්‍ය මිල අධික නිසා එහි මිල රැපියල් විසිතිස්දාහකින් වැඩි කරන්න සිද්ධ වෙනවා. එතකොට මේ ව්‍යාපාරය කරගන්න බැරි තත්ත්වයකට පත්වෙලා තියෙනවා. විදුලි බිල වැඩි නිසා ලී ඉරුම් බිල වැඩිවෙලා තියෙනවා. ඒ නිසා අහිංසක වඩුවා තමයි දුක් විඳින්නේ. ඒ නිසා සභාවේ අවධානය යොමු කරලා ඉතා

ඉක්මණින් මේ වඩු කර්මාන්තය රැකගැනීම සඳහා ඔවුන්ට සහන ලබාදෙන්න අවශ්‍ය කටයුතු සලසන මෙන් ඉතාමත් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා.

**03(11) <u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ මම මේ පැමිණිල්ල ඉදිරිපත් කරනවා. අපි ලෝක ළමා දිනය සමරන්න සූදානම් වන අවස්ථාවේදී ලෝක සංවිධානය අපිව භයවන ස්ථානයට පත්කරනවා මන්දපෝෂණයෙන්. ඒවගේම මොරටුව මහා නගර සභාවෙන් පෙර පාසල් දහනවයක් පාලනය කරනවා. එහි ළමයින් හාරසියපණහක් පමණ ඉන්නවා. දරුවන් වෙනුවෙන් මේ සභාවෙන් ලක්ෂ විසිදෙකක් වෙන්කරනවා. දැන් මාස අටක් ගතවෙලත් අද වෙනතුරු දරුවන්ට දිවා ආහාරය දෙන්න බැරිවෙල තියෙනවා. මම දෙතුන් වතාවක්ම මේ ගැන කොමසාරිස්තුමාවත් දැනුවත් කරලා තියෙනවා. තව වෙනතුරු මට කිසිම පිළිතුරක් දීලා නැහැ. අපේ දරුවන්ව මන්ද පෝෂණයෙන් ආරක්ෂා කරමු. මෙයට විකල්පයක් යොදන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා.

**03(12) මහා නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, මුලින්ම ස්තූතිවන්ත වෙනවා ඔබතුමාටත්, නාගරික කොමසාරිස්තුමාටත්, පසුගිය දිනවල පදික වේදිකාවල වෙළදාම් කරන අය සම්බන්ධයෙන් කරන ලද ක්‍රියාත්මක වීමේදී අපේ ලිඛිත මැදිහත්වීමට ප්‍රතිචාරයක් දක්වමින් ඊට අවශ්‍යවන වැඩපිළිවෙල සූදානම් කරන්න අදාල නිලධාරීන්ට උපදෙස් දීලා එම කටයුතු ආරම්භ කිරීම සම්බන්ධයෙන් මම ස්තූතිවන්ත වෙනවා. ගරු නගරාධිපතිතුමනි, ඒ කාරණය මේ සභාවේ ඔබතුමා මතුකරාම සභාවේ අදහස් ඉදිරිපත් වුණා ලියුම් ලිවීම සම්බන්ධයෙන්. ගරු නගරාධිපතිතුමනි, මිනිස්සු ජීවිතයේ පුරුදු වෙච්ච දේවල් තියෙනවා, දන්න දේවල් තියෙනවා, පුළුවන් දේවල් තියෙනවා, බැරි දේවල් තියෙනවා. අපි දන්නේ ලියන්න, අපි දන්නේ කතා කරන්න. අපි මන්න ගෙනල්ලා, කඩු ගෙනල්ලා, පිහි ගෙනල්ලා, මිනිසුන්ට තර්ජනය කරලා වැඩ කරන්න අපි දන්නේ නැහැ, පුරුදු නැහැ. අපි දන්න විදියට අසාධාරණයක් කියලා දැනුණාම ඒක ගැන වචනයෙන් කියන්න, එහෙම නැත්නම් එය ලියන්න. තමයි අපි දන්නේ.

- සභා ඝෝෂා -

ගරු නගරාධිපතිතුමනි, ඒ ගැන වැඩිදුරටත් කතා කරන්නේ නැහැ.අපි නියමිත කාල වලදී නියමිත මැදිහත් කිරීම් කරලා තියෙනවා. විශේෂයෙන්ම අපි දීර්ඝ කාලයක් තිස්සේ මොරටුව දකුණු ප්‍රදේශයේ යටවීම් ගැන කතා කරනවා. නැවත වැසි කාලය පැමිණියා. මෙය උග්‍ර ප්‍රශ්නයක් බවට පත්වෙලා තියෙනවා. මේ සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත්වීම් ඔබතුමා සහ නගර සභාව කල බව අපි පිළිගන්නවා. නමුත්, මෙයට සියයට සියයක් විසඳුමක් ලැබිලා නැහැ. විශේෂයෙන්ම ජෝසප් පෙදෙස පටුමග පහළ අපිට දැනෙන විදියට අපි විසඳුමක් කිව්වා. එය නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවත් බලලා දුම්රිය දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණය ඇවිල්ලා සාකච්ඡා කරලා එයට විසඳුමක් දුන්නා. හැබැයි එය ප්‍රායෝගිකව සාර්ථක වෙලා නැහැ. ගරු නගරාධිපතිතුමනි, අදත් ජෝසප් පෙදෙස යටවෙලා. ඒ ගහපු බටය මුහුදට දික්කරාට විතරක් මදි. ඔබතුමත් කිව්වා ඒ මාර්ග කලුගල් දාලා කාණු පද්ධතියට ජල පහර ඇතුල් වෙන එක වළක්වන්න කියලා. නමුත් එය සිදුවුණේ නැහැ. බටය දික් කිරීමෙන් වුණේ මුහුදුවැලි ඇවිල්ලා තවදුරටත් අවහිරවුණ එක විතරයි. නගරාධිපතිතුමනි, මෙයට සෘජු මැදිහත්වීමක් කරන්න මෙය විශාල ප්‍රශ්නයක්. මේ වැහි කාලවලට ඔබතුමාලා ජීවත්වන ප්‍රදේශවල නැතිවුනාට අපේ ප්‍රදේශ වලට විශාල ප්‍රශ්නයක්. අද මිනිසුන්ට පාරට බහින්න විදියක් නැහැ. ළමයින්ට පාසැල් යන්න විදියක් නැහැ. ඒ කාරණය පිළිබද සෘජුව මැදැහත්වීමක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(13) නියෝජ්‍ය නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා කතා කළ කරුණට අදාළව මම කිහිපවතාවත් ඉංජිනේරු මහත්මියව දැනුවත් කළා. ප්‍රදේශවාසීන් කිව්වා. මම ඒ ස්ථානයටත් ගිහිල්ලා පරීක්ෂා කළා. නමුත්, දැන් අපිට නැවත හදන්න අවශ්‍ය වුනොත් රේල් ක්‍රොසින් එක ගලවල අරගෙන ගිහිල්ලා තියෙනවා. ගලවගෙන යන අවස්ථාවේ මම කොමසාරිස්තුමාට කතා කළා, ඉංජිනේරුතුමාට කතා කරලා කිව්වා මෙය නිසියාකාරව හදාගන්නකන් මෙය ගෙනියන්න දෙන්න එපා කියලා. ඒක උනන්දු වුනේ නැහැ. නමුත් එතන රේල්වේ නිලධාරීන් කිව්වේ නගර සභාවෙන් දැනුම් දුන්නා අපට එය අවශ්‍ය නැහැ. ගලවගෙන යන එක ගැන ගැටළුවක් නැහැ කියලා. නැවත රේල්වේ ක්‍රොසින් එකක් දාන්න වුනොත් අපි සී. ජී. ආර්. එකට ලියුම් ලියලා අපිට සමහරවිට මුදල් බඳින්නත් සිද්ධ වෙයි. එය ක්‍රියාත්මක නොවුන එක පිළිබඳව මගේ කණගාටුව ප්‍රකාශ කරනවා.

**03(14) නියෝජ්‍ය නගරාධිපති - ජී. එම්. සුරංග අපෝන්සු මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2023 වර්ෂයේ මොරටුවේ දුප්පත් ජනතාවගේ දරුවන්ට අවශ්‍ය අභ්‍යාස පොත් අධ්‍යාපන වාරය ආරම්භ කිරීමට පෙර කල්වේලා ඇතුව අභ්‍යාස පොත් ලබාදීමට කටයුතු කරන්න කියලා ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**03(15) මහා නගර සභා මන්ත්‍රී - එම්. ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, නගරයේ තියෙන ප්‍රශ්නවලට ඔබතුමාට අවශ්‍යතාවය තියෙනවා නම් ගොඩක් දුරට සෘජු මැදිහත්වීමක් කරලා ප්‍රශ්න විසඳීමේ හැකියාවක් සහ බලය ඔබතුමාට සතුව තියෙනවා. ඒ දේ තියෙද්දි ඇයි සමහර දේවල් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවන්නේ කියන එක ඇත්තටම අපිටත් ලොකු ගැටලුවක් මම කාරුණිකව ඔබතුමාගෙන් ඉල්ලීම් ටිකක් ඉල්ලන්න කැමතියි. මෙය වසර ගණනාවක්

තිස්සේ මේ සභාවේ කතා කරලා තියෙනවා. දකුණු වෙරළ තීරයේ මුහුදු ඛාදනය සම්බන්ධයෙන් වර්තමානය වනවිට උස්වත්ත ප්‍රදේශය ගත්තොත් ඒ පැත්තේ ගෙවල් අධික වර්ෂාව වාරකන් කාලය හින්දා මේ වෙනකොට ගහගෙන යනවා. ඒ සම්බන්ධයෙන් අපි එවකට යහපාලන රජය හරහා මැදිහත්වීමක් කරලා තාවකාලිකව ගල්වැටි යම්තාක්දුරට සකස් කිරීමට කටයුතු කලා. ඊට අමතරව ඔබතුමාලගේ මැදිහත්වීමෙන් එක්තරා ප්‍රදේශයක යම්කිසි දුරකට දැම්මා. හැබැයි එතනින් එහාට එය අද වෙනතුරු නැවතිලා තියෙනවා. මුහුද අයිනෙ තියෙන ගෙවල් ආයෙත් ගහගෙනයාමේ තර්ජනයට ලක්වෙලා තියෙනවා. කනගාටුවට කරුණ ඉන්න වැසියන්ට නීත්‍යානුකූල ඔප්පු තියෙනවා. එම පුද්ගලයන්ට එක්කො රජය හරහා ඉඩම් දෙන්න ඕනැ. එහෙම දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. මොරටුවේ ප්‍රදේශයේ අපි දැක්කම කිසිදු විකල්ප නිවාස යෝජනා ක්‍රමයක් කාලයක් තිස්සේ අපි දැකලා නැහැ. මේ මුහුදු වෙරළෙ ඉන්න ජනතාවට ඇත්තටම තමුන්ගෙ නිවාස සම්බන්ධයෙන් ලොකු තර්ජනයක් වෙලා තියෙනවා. ඔබතුමාට මේ ප්‍රශ්න අවංකව විසඳීමට අවශ්‍යතාවය තියනවානම් ඔබතුමාලට සෘජු මැදිහත්වීමක් කිරීමේ හැකියාවක් තියෙනවා. මට මතකයි අපි වසර ගණනාවක් මේ සම්බන්ධයෙන් සභාවේ කතා කරලා තියෙනවා. ඉල්ලීම් කරලා තියෙනවා. නමුත්, මම අහන්න කැමතියි මේවා ජනතාවට සේවා සපයන ආයතනය අඩුම ගානේ අපිට මේ දේවල් කිරිමට මුදල් නැතිවුනත් අදාල ආයතන වලට ඉල්ලීමක් කරලා ජනතාව වෙනුවෙන් හඬනැගීමට ඔබතුමාට හැකියාව තියෙනවා. ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නේ උස්වත්ත ප්‍රදේශයේ ජනතාවගේ ගෙවල් ගහගෙන යනවා. අපි දන්න දෙයක් තමයි කෝප් සිටි එක හදනකොට එතන මුහුද ගොඩකිරීමක් සිද්ධ වෙනකොට එහෙන් මුහුද ගොඩකරනකොට මෙහෙන් ඛාදනයට ලක්වෙනවා. ඉදිරිය දිහා බලලා මේ දේවල් වලට විසඳුම් දුන්නේ නැත්නම් අයිනෙ ගෙවල් විතරක් නෙමෙයි ටිකක් මෙහාට තියෙන ලොකු ගෙවල් වුනත් ගහගෙනයාමටත් හැකියාව තියෙනවා. අනිත් එක මේ ගෙවල්වල ඉන්න මිනිස්සුන්ට නීත්‍යානුකූල ඔප්පු හිමි පුද්ගලයන්ට රජයේ මේ තීන්දු තීරණ හරහා තමයි මේ ප්‍රශ්නවලට මුහුණදෙන්න තියෙන්නේ. එතකොට ස්වභාවික ව්‍යසනයන් වලට පත්වෙනවා අපි දූපත් රාජ්‍යයක් අපි දකින දේ තමයි රටක් හැටියට ගත්තම මේ ප්‍රතිපත්තිවල ලොකු ගැටලු තියෙනවා. මේ ප්‍රතිපත්ති රජයන් මාරුවන විට ප්‍රතිපත්ති මාරුවෙනවා. එතකොට මේ දේවල් දිගු කාලීන සැලැස්මක් ඇතුව බලන්නේ නැහැ. ඉතින් අවසානයේදී සෑම සියලු දේකින්ම පීඩාවට පත්වන්නේ අසරණ ජනතාව. ඉතිං මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරන්න කැමතියි. මේ කොට්ඨාශ භාර මන්ත්‍රීතුමත් ඉන්නවා අපිත් කොට්ඨාශයේ මන්ත්‍රීතුමන්ලා නොවුනාට අපිටත් මෙයට යම්කිසි දෙයක් කරන්න පුළුවන්.මම ඉල්ලීමක් කරනවා ඔබතුමාගේ සෘජු මැදිහත්වීමෙන් වෙරළ තීරය ඛාදනය වීම සම්බන්ධයෙන් ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් පලවෙනි ඉල්ලීම කරනවා. දෙවෙනි ඉල්ලීම තමයි නගරාධිපතිතුමනි, කුණු කසල සම්බන්ධයෙන් ඔබතුමාගේ කතාවක තිබ්බා "කුණු නැති හිතක් ලස්සන රටක්'' කියලා. ඒත් අද වෙනකොට මොරටුව නගරය ඇයි මේ කුණු එකතු කිරිම සම්බන්ධයෙන් ගැටලුවක් තියෙනවද ඉතිං එය ඇත්තටම බදු ගෙවන ජනතාවට අපි නගර සභාවෙන් සපයන්නේ සීමිත වූ සේවාවක්. එය අපිට දෙන්න බැරිනම් ඇතිතටම ලොකු ගැටලුවක්. අද මේ තාක්ෂණය හරහා ඉස්සරහට යන රටක අපි ඉන්නේ. පෙට්‍රල් ගහන්න කිව්ආර් කෝඩ් තියෙනවා. ජනතාවට තමුන්ගේ කුණු ලොරිය කවදාද එන්නේ කියලා පොඩි ඇප් එකක් හදන්න බැරිද මේ නගර සභාවේ වරිපනම් අංකය දාලා. ඒ දේවල් තාක්ෂණය හරහා එකතු කරන්න බැරිද. ඇයි අපි හනම්ටි ලෝකයේ ජීවත් වෙන්නේ. කලාප ගණනාවකට මොරටුව නගර සභාව බෙදලා කුණු එකතු කිරීමේ ව්‍යාපෘතිය තියෙනවා. ඇයි ජනතාවට මේ සේවාවන් මීට වැඩිය කාර්යක්ෂමව ලබාදෙන්න බැරි. ඔබතුමාට බලය තියෙනවා. උනන්දුව සහ ඕනෑකම තියෙනවා නම් ඔබතුමාට කරන්න බැරිකමක් නැහැ. ඔබතුමා අවුරුදු පහළොවක් ඔය පුටුවේ ඉදන් හිටියා. අපි ඔය පුටුවල ඉදගෙනත් නැහැ. ඔබතුමා මේ දේවල් ක්‍රියාත්මක නොකරන්නේ කියන එක ගැටලුවක්. තුන්වෙනි කාරණය ලංකාවේ ආර්ථික අර්බුදය ගැන කතා කළොත් රාජ්‍ය ආයතන පාඩුලබන තත්ත්වයට පත්වෙලා තියෙනවා. මොරටුව මහා නගර සභාව ගත්තොත් මෙහි සේවකයන් එක්දහස් අනුවක් පමණ සිටිනවා. නමුත්, අදාල සේවාවන් කාර්යක්ෂමව සිද්ධ වෙන්නෙත් නැහැ. එක අතකින් ඔබතුමා කියනවා සේවකයන් මදි කියලා. තව අතකින් අපිට පැමිණිලි හම්බවෙනවා සේවකයින් ඇත්තටම ඒ ස්ථානවල සේවා කරනවාද කියලා. මම ඉල්ලීමක් කරන්න කැමතියි එකක් සේවකයෝ සම්බන්ධයෙන්, එකක් වියදම සම්බන්ධයෙන් විගණන අංශයට ඇයි බැරි නගර සභාවේ වියදම් සම්බන්ධයෙන් විගණනයක් කරලා අපිට වියදම් අඩු කිරීමට හැකියාවක් තියෙනවාද කියලා සලකා බලන්න. හතරවෙනි කරුණ නඩු ගණනාවක් තියෙනවා මේ නඩුවලට යන වියදම් ගැන ගත්තොත් ඇත්තටම මේවගේ නගර සභාවකට පුදුම ලොකු වියදමක් නගරාධිපතිතුමනි, නඩු ඇපිල් කරනවා ජනාධිපති නීතීඥවරු රිටන් කරනවා. මේ ප්‍රශ්න අපි විසින් ඇතිකර ගන්න ප්‍රශ්නද, නැතිනම් ප්‍රශ්නවලට විසඳුම් අපි විසින් ලබාගත යුතුද කියලා අපි සලකා බලන්න ඕනැ.

අවසානයේදී මේ ඔක්කොම ජනතාවගේ මුදල්. මේවා අපේ අමනෝඥ්ඥ ක්‍රියා නිසා ගත්ත තීන්දු තීරණවල ප්‍රතිඵලද කියලා අපිම සලකා බලන්න ඕනෑ. ලක්ෂ පහළොවවල් දවසට හැටදෙදහස්පන්සියයවල් ඒවගේ විශාල ගණන් ගෙවන්නෙ. ඉතිං මෙය කොච්චර සාධාරණද කියන එක අද නීතීඥතුමිය ඉන්නවා මම ඉල්ලීමක් කරන්නේ මම මෙය හැමදාමත් කියනවා. සෙට්ල් කරන්න පුළුවන් නඩු තියනවා නම් වහාම අපි සෙට්ල් කරමු. නගර සභාවේ නඩු විසිහතරක් තියෙනවා. ඇත්තටම අවශ්‍යද? අනවශ්‍යද? කරුණාකරලා මේ දේවල් සම්බන්ධයෙන් මීට වැඩිය අවධානය යොමු කරන කියලා ඉල්ලීමක් කරනවා.

03(16) <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ වෙන කොට රටපුරා නැවත කොවිඩ් 19 වසංගතය හිස ඔසවමින් තියෙනවා. මේ කථාකරන මොහොත වෙනකොට කොවිඩ් 19 හේතුවෙන් මරණ 50ට ආසන්න ප්‍රමාණයක් සිදුවෙලා තියෙනවා. අපි සභාවක් විදියට ඔබතුමාගේ නායකත්වයෙන් කොවිඩ් පලවෙනි රැල්ල, දෙවෙනි රැල්ල ආරම්භ වු සැනින්ම ඉතාමත් හොඳ විධිමත් ලෙස ඒ කොවිඩ් මර්ධනය සඳහා මොරටුව මහා නගර සභාව මැදිහත් වුණා කියලා අපි කවුරුත් දන්නවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, දැන් අපේ රටේ මිනිස්සුන්ට කොවිඩ් අමතක වෙලා තියෙන වේලාවක්. ඒ එක්කම තියෙන සෞඛ්‍ය ඒ ආරක්ෂණ විධික්‍රම අමතක වෙලා තියෙන වෙලාවක්. නමුත් කොවිඩ් වසංගතය හිස ඔසවන වේලාවක්. තාමත් හරියට නිසිලෙස PCR පරීක්ෂණය සිදුනොවිම හේතුවෙන් අපේ රටතුල නිශ්චිතව කොච්චර රෝගීන් ප්‍රමාණයක් පැතිරෙනවාද කියලා හරියටම වටහා ගත්ත නොහැකි වේලාවක්. ඒ නිසා මම ඔබතුමාගෙන් පළමුව ඉල්ලා සිටිනවා අපි හැම වසංගතයකම ආරම්භවීමට ප්‍රථම ක්‍රියාත්මක වෙන සභාවක් නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරලා ඉදිරියේදි යම් සැලසුම් හදන්න කියලා ඉල්ලීමක් කරනවා. දෙවෙනි එක තමයි ගරු නගරාධිපතිතුමනි, මා නියෝජනය කරන බොරුපන කොට්ඨාශයේ අපි කවුරුත් දන්නවා ඔබතුමත් දන්නවා ලක්සිරිපුර ප්‍රදේශයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතු ඉඩමක් තියෙනවා. මම මහජන උපයෝගිතා කමිටුවේ සභාපතිවරයා වශයෙන් ඉන්න කාලේ අපි උත්සාහ ගත්තා ඒ භූමිය සංවර්ධනය කිරීම වෙනුවෙන් යම්කිසි අපේ පැත්තෙන් යෝජනාවක් තිබ්බා ළමා ක්‍රිඩාංගනයක් හදන්න කියලා. එතකොට ප්‍රශ්නයක් වුණා ප්‍රාදේශිය ලේකම් කාර්යාල ඉඩමක අපේ සල්ලි යොමු කරන්නේ කොහෙමද කියන ප්‍රශ්නයක් ආවා. ඒ නිසා අපි නිරන්තරයෙන් උස්සාහ ගත්තා ඒ ඉඩම අපිට ලබාදෙන්න, පවරන්න කියලා. අපි වසර ගණනාවක් ඒ සම්බන්ධයෙන් ලිපි හුවමාරු වුණා. නමුත්, අවසානයේදි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් කිව්වා ඒ ඉඩම අපිට පවරන්න බැහැ කියලා. ඒ නිසා අපේ සංවර්ධන කටයුතු සියල්ල නැවතුණා. නමුත්, ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට ඒ හිස් ඉඩමේ විශාල විදියට ගස් වැවිලා විශාල පාරිසරික හානියක් ඒ ප්‍රදේශවාසින්ට සිද්ධවෙමින් තියෙනවා. මේ වෙනකොට ගරු නගරාධිපතිතුමනි, ඩෙංගු රෝගීන් කිහිපදෙනෙක් ඒ අවට වාර්තාවෙලා තිබෙනවා. ප්‍රාදේශිය ලේකම්ට කථාකරලා කිව්වාට වැඩක් නැහැ. ඒ සම්බන්ධයෙන් උත්තරයක් නැහැ. ගරු නගරාධිපතිතුමනි, ඒ නිසා මගේ යෝජනාවක් විදයට තියෙන්නේ අපිට මේ සභාව මගින් මම මේ සභාවේ මන්ත්‍රිවරයෙක් වශයෙන් කොට්ඨාශ මන්ත්‍රිවරයා විදියට එතනට දැනුවත් කරනවා වගේම මෙතනින් ඔබතුමා හරහා අපි විශේෂයෙන් කොමසාරිස්තුමා හරහා ඉල්ලීමක් කරන්න ඒගොල්ලෝ ඉඩම භාරගත්තා නම් එගොල්ලෝ එක නඩත්තු කරන්න ඕනෑ. එයාලා අතින් නඩත්තුවෙන් නැතිවුනාම ඒකෙන් ඇතිවෙන පාරිසරික විනාශයට බැනුම් අහන්නේ නගර සභාව, ඔබතුමා, අපි. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලනවා පළවෙනි එක ඩෙංගු. දැන් මේ වෙනකොට යම් පැතිරීමක් සිදුවෙලා තියෙනවා. ඒ ආශ්‍රිතව ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. මොකද මහජන පරික්ෂකවරු දෙපලක් ඉන්නවා සභාව නියෝජනය කරන. මහජන පරික්ෂකතුමාත් ඉන්නවා. ඒවගේම එම්. ඕ. එච්. එක නියෝජනය කරන කෙනාත් ඉන්නවා. මම දෙන්නාටම කථාකළාම ඒ දෙන්නාම කියපු දේ තමයි ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න විදියක් නැහැ. දුම් ගහන්න විදියක් නැහැ. ඒ අවශ්‍ය කරන දේවල් නැහැ. ඩීසල් නැති ප්‍රශ්න කියලා ප්‍රායෝගිකව මම පිලිගන්නවා. නමුත් ගරු නගරාධිපතිතුමනි, මෙය විශේෂ තත්ත්වයක් විදියට සලකලා ඒ භූමිය සභාව මඟින් සුද්දකරලා දිලා ඊලඟට අපේ සභාව මගින් හෝ එක්කෝ ඒගොල්ලෝ කරනවා නම් ඉඩම ඒගොල්ලන්ගේ භාරයේ තියෙනවා නම් මිනිස්සුන්ට හානියක් නොවන විදියට ඒක නඩත්තු කරන්න ඕනෑ. එහෙම නැත්නම් අපේ සභාවට මේක පවරන්න කටයුතු කරන්න ඕනෑ ගරු නගරාධිපතිතුමනි. මේ අතරමැද තියාගෙන ඉඩම් තියාගෙන කිසිදු විදියකින්වත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න නොවි ඒගොල්ලෝ නඩත්තු නොකර එකෙන් සිද්ධවෙන අවාසිය විතරක් සභාවට එන තත්වයක් තියෙන්නේ. ඒ නිසා එක අපි වළකගන්න ඕනෑ. ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා එකක් ඩෙංගු මර්ධනය වෙනුවෙන් යම්කිසි මැදිහත්වීමක් ගරු නගරාධිපතිතුමනි, සිද්ධ කරන්න අපේ

අපහසුතාවලට යටත්වයි මම ඉල්ලන්නේ. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, ඉඩම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග වලට අපි නැවත යොමු වෙමු කියලා මම නැවත මහජන උපයෝගිතා කමිටුවට ඕනනම් යෝජනාවක් දාන්නම්. ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරන්න ඔබතුමා ප්‍රාදේශිය ලේකම්තුමියත් එක්ක.මොකද අපිට වගේම මොරටුවේ ප්‍රධාන පුරවැසියා ඔබතුමා ඒ නිසා ඔබතුමා ඒ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**03(17) <u>මහා නගර සභා මන්ත්‍රී - එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, වැඩකරන්න දන්නේ නැති අය වැඩ කරන්න බැරි අය වැඩ කරන්න හැකියාවක් නැති අය ගරු නගරාධිපතිතුමනි අනුන් සංවිධානය කරන පෙරහැරේ ඉස්සරහායින්ම මල් බයිසිකලයක් අරගෙන යන්න හරි කැමතියි. එහෙම නැත්නම් නිලමේට ඇදගෙන යන්න හරිම කැමතියි. එහෙම නැත්නම් කරඬුවට අතගහන්නත් හරිම කැමතියි. එක තමයි මම හිතන්නේ වැඩ කරන්න බැරි අයගේ එකම අරමුණ. ගරු නගරාධිපතිතුමනි මම හිතන්නේ එවට එහෙම කියනකොට යම් යම් දෙවල් විවිද කිතිකැවීම් ඇතිවෙනවා. කවුරුවත් කැමති නැහැ ගරු නගරාධිපතිතුමනි අනුන් සංවිධානය කරන පෙරහැරේ අවසානේට කුණු කරත්තයක් අරගෙන ගිහිල්ලා කුණු ටිකක් පටවලා එහෙම දෙයක් කරන්නනම්. මම හිතන්නේ කිසිම කෙනෙක්ගේ එහෙම අදහසක් නැහැ. මම කියන්නේ ගරු නගරාධිපතිතුමනි අපි මිනිස්සු ගැන කථාකරද්දි මිනිස්සුන්ගේ ප්‍රශ්න නෙමෙයි නියෝජිතයන් කථාකරන්නේ. අර හැමදාම රැල්ලට එන ජනප්‍රියදේ තමයි හැමෝම ගෙන්නේ. ඉතින් ඒක නෙමෙයි මම හිතන්නේ විපක්ෂයකින් හෝ අපෙන් විය යුත්තේ විය යුත්තේ මිනිස්සුන්ට වියයුතු දෙයක් කථාකිරිම. දැන් මේ කථා වුනා ලියුමකින් මුලු ගමක්ම සුද්ද කරා කියලා. ගරු නගරාධිපතිතුමනි එක ගැන මමත් කියන්න කැමතියි. මොකද මේ ඇවිල්ලා ව්‍යාපාරිකයින්ට ඉතාමත් අපහසු කාලයක් ව්‍යාපාරිකයො බොහොම අමාරුවෙන් ඒ කියන්නේ අපි විශේෂයෙන්ම නගර සභාවක් විදියට අපි මේ අවස්ථාවේදි ගත යුතුයි අපිට බදු ගෙවන අපිට ඒ අවශ්‍යා අපි සභාවෙන් යැපෙන ව්‍යාපාරිකයො කියන්නේ අපි මූලිකත්වය ගතයුතුයි ගරු නගරාධිපතිතුමනි. ටවුන් වල ඉන්නවා ව්‍යාපාරිකයෝ බදු ගෙවනවා ඔවුන් කරන ව්‍යාපාරයම මුලු පේමන්ට් එකම ආවරණය කරගෙන යම් යම් ව්‍යාපාරිකයෝ ඔවුන්ගේ ව්‍යාපාරවලට බාධාකරමින් ව්‍යාපාර කටයුතු කරනවා. අනිවාර්යෙන් වියයුතු දෙයක් තමයි ගරු නගරාධිපතිතුමනි ඔවුන්ගේ ව්‍යාපාර කරගෙන යාමට අපි ඔවුන්ට පහසුකම් ලබාදිය යුතුයි. නැත්නම් මේ එක එක්කෙනාගේ අවශ්‍යතාවයට එක් එක්කෙනා චුන්කරන්න මේ කියනවා වගේ ඔවුන්ගේ ආරක්ෂාව නෙමෙයි අපි බලාගත යුත්තේ මොරටුවේ වරිපනම් බදු ගෙවමින් ජල බිල්පත ගෙවන විදුලි බිල්පත ගෙවන ව්‍යාපාරිකයන් වෙනුවෙන් අපි සිටිය යුතුයි. ඒක කියන ගමන් ගරු නගරාධිපතිතුමනි අපි අනෙක් ව්‍යාපාරිකයන් ගැනත් යම් කිසි ආවරණයක් විය යුතුයි මහජන නියෝජිතයන් විදියට. මම යෝජනාකර සිටිනවා අපි ඒ පේමන්ට් එක සුද්ද කරනවා වගේම අපිට පුලුවන්නම් පදිකවෙදිකාවේ ඉන්න වෙළඳුන්ගෙන් මම හිතන්නේ ඔබතුමා හැමදාම කියන දෙයක් තමයි ජංගම වෙලදාම සඳහා කිසිම කෙනෙකුට කිසිම බාධාවක් නැහැ.ඉතින් ඔය ඉන්න ඕනම වෙළදෙකුට ඕනම අවස්ථාවක ජංගම වෙළඳාම කරන්න පුලුවන්නේ. අපට පුලුවන්නම් යම් කිසි ප්‍රමිතියකින් යුක්ත කරත්ත ටිකක් හදලා දෙන්න ඒ ජංගම වෙළඳාම කරන්න තියෙන්නාවූ කොට්ඨාශවලට අඩුගානේ එක කරත්තය බැගින් හරි දාලා ජංගම වෙළඳාමක් කරන්න දෙන්න පුලුවන්නම් ගරු නගරාධිපතිතුමනි මම හිතනවා එක අපේ ජනතාවට පාරිභෝගික අවශ්‍යතා සපිරේයි. එතකොට දුප්පත් මිනිස්සුන්ගෙත් අවශ්‍යතා සපිරේයි කියන යෝජනාව මම කරනවා.

**03 (18) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පොඩි අනාවරණයක් කරගැනිමට අවශ්‍යයි. මේ සභාවේ මට මතක හැටියට දැනට අවුරුදු 7, 8කට කලින් ඉදන් තිබ්බා ජෙනරේටරයක්. ජෙනරේටරය මම හිතන්නේ ලුනාව කලපු ව්‍යාපෘතියෙන් හම්බවුනේ. ඒක තිබ්බේ ටේලරයත් එක්ක. නමුත් දැන් හොයලා බලද්දි ජෙනරේටරය දැන් නැහැ. දිගින් දිගමට හොයා බලද්දි ඒ ජෙනරේටරය අබිලි ද්‍රව්‍ය ලෙස වෙන්දේසි වෙලා තියෙනවා. ඒ නිසා නගරාධිපතිතුමනි, මෙහෙම අලුත්ම ජෙනරේටරයක්. ටේලරය දිරලා කියලා රෝද හතරේ ජෙනරේටරයක් එක්ක ජෙනරේටරය අබලි කියලා විකුණන්න තරම් රු.10000 කට විකුණලා තියෙන්නේ. ඒ නිසා එක සොයා බලන්න ඕනේ. ඒ කමිටුවක් පත්කරලා තියෙනවා. ඒ කමිටුවෙන් බලලා තියෙනවාද කිලෝවොට් 16 ක ජෙනරේටරයක් රු.10000කට දිලා තියෙන්නේ. මම හිතන්නේ ටයර් එකක ගන්න බැහැ රු.10000ට. ටයර් 4 ටේලරය සමග දිලා තියෙන්නේ මේවෙනකොට එ ජෙනරේටරය තියෙන තැනත් මම දන්නවා. ඒනිසා මම හොයා බලනවා. ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා කමිටුවක් පත්කරලා කමිටුව

හරහා තමයි මෙය අබිලි මොකක්ද කියලා තින්දු කරන්න ඕනේ රු.10000 කට මේ ජෙනරේටරය ගියේ කොහොමද මේ නිලධාරින් කොහොමද කටයුතු කරන්නේ කියලා හොයලා බලලා අපිට වාර්තාවක් දෙන්න. ඉතින් මෙහෙම කොච්චර දෙවල් යන්න ඇතිද ට්‍රැක්ටරය දානවා. කැලි ටික ගලවනවා ගරාජයේ තියාගන්නවා. ට්‍රැක්ටරය වෙන්දේසි කලාට පස්සේ කැලි ටික එහා පැත්තෙන් ගිහිල්ලා ගරාජයේ කට්ටිය දිලා ට්‍රැක්ටරය පැදගෙනම යනවා. එහෙම අබිලි කරන්නේ කොහොමද කියලා ඔබතුමා අපිට විමර්ශනයක් කරලා වාර්තාවක් ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03 (19)** **මහා නගර සභා මන්ත්‍රී - පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, ලුනාව ජනතාව අද උදෑසන මුහුණදුන් ඒ සිදුවිම ගැන ඇත්තටම කණගාටුවෙනවා. ගරු නගරාධිපතිතුමනි, මම හිතනවා ඔබතුමාගෙත්, කොමසාරිස්තුමාගෙත් ඒවගේම ඉංජිනේරුතුමියගෙත් මැදිහත් විමෙන් අපි පසුගිය මාස කිහිපයේම විශේෂයෙන් වාරකන් කාලේ ජලයෙන් යටවිම වලක්වාගෙන මෝය කපන්න අපිට නිසි ආකාරයෙන් හැකියාව ලැබුණා. නමුත් අවාසනාවකට ඊයේ උදෑසන මම ඉංජිනේරුතුමියට කථාකරලා කිව්වාම මෙහෙම මෝය පිරිලා කිව්වාම ඇත්තටම එතුමිය අවශ්‍ය කටයුතු සලසලා දිලා නිළධාරින් එවලා තිබ්බා. නමුත් ගරු නගරාධිපතිතුමනි, දවල් 12 වෙනකොට මෝය කපලා අවසන් කියලා මට දැනුම් දුන්නා. මම එකට යනකොටත් වතුර බහින්නේ නැහැ. පස්සේ හොයලා බැලුවාම මේගොල්ලෝ JCB යන්ත්‍රයත් අරගෙන ඇවිල්ලා තිබුණා. මම හිතන්නේ පැයක් පැය භාගයක් මෝය කපලා වතුර බැහැලා යන විදිය නිරික්ෂණය කරලා තමයි එන්න ඕනෑ. නමුත් ඊයේ අවාසනාවට එය සිද්ධවෙලා තිබ්බේ නැහැ. එකේ අවසාන ප්‍රතිඵලයක් විදියට අදවෙනකොට ධීවර නිවාස ලුනාව අවට සැම ප්‍රදේශයක්ම යටවෙලා. විශේෂයෙන්ම අපි දන්නවා මේ ආර්ථික අපහසුතාවෙන් ඉන්න අවස්ථාවක වඩුකාර්මිකයන් විශේෂයෙන් ඔබතුමා වඩුකාර්මිකයෙක් විදියට දන්නවා මෝටර් යන්ත්‍ර පවා පිච්චිලා තියෙනවා වතුරට යටවෙලා. ඒ සිදුවිම සිද්ධවෙලා තියෙන්නේ අවශ්‍ය කටයුත්ත කෙරිලා මෝයත් කපලා එගොල්ලෝ කියනවා මෝය බැස්සයි කියලා නමුත් ඒ සුලු කාලය පැයක් හෝ පැය භාගයක් ඒක නිරික්ෂණය කලානම් අර මුහුදෙන් එන වතුරට වැහෙන්නැති වෙන්න වැහුනානම් නැවත කපන්න අවස්ථාව තිබ්බා 12 ඉදලා හවස 4,5 වෙනකම් නමුත් එතනදි වෙච්ච යම්කිසි ප්‍රමාද දෝෂයක් හින්දා අද උදෑසන පාන්දර 4 ඉදලා දුරකථන ඇමතුම් විශාල ප්‍රමාණයක් ආවා මුලු කලපුවම යටවෙලා ගෙවල්වලටත් වතුර දාලා මම ගාව ඡායාරූපත් තියෙනවා, විඩියෝත් තියෙනවා. එනිසා මම හිතනවා මන්ත්‍රිකෙනෙක් විදියට පත්වෙලා මේ සිදුවෙච්ච 4 වෙනි අවස්ථාව තමයි ගෙවල් යටවිම. මුල් අවස්ථා තුනේදි මටත් අත්දැකිමක් නොතිබුනත් මම ඊට පස්සේ ඔබතුමාගෙත් මේ සියලු නිලධාරින්ගෙත් සහයෝගය ඇතිව මේ කටයුතු අදවෙනකම් කරගෙන ආවා කිසිම දෙයක් සිදුවුනේ නැහැ. නමුත් අවාසනාවකට දැන් වාරකනුත් ඉවරයි මුහුදේ ඒ සැරත් අඩුවෙලා තිබ්බේ. මේ සිදුවිම යම්කිසි ප්‍රමාද දෝෂයකින් සිදුවෙලා තියෙනවා. ඒ නිසා නැවත නැවතත් මේ දෙවල් නොවෙන්න ඒ අදාල නිළධාරින් දැනුවත් කරලා ඒ සඳහා කටයුතු කරන්න කියන ඉල්ලිම කරනවා.

ගරු නගරාධිපතිතුමනි මම මිට පෙර සභාවෙදිත් ඉල්ලිමක් කරා විශේෂයෙන්ම ලුනාවට තියෙන එකම පාසල ලුනාව කණිෂ්ඨ විදුහල එතන පාසලේ ළමයි හාරසියයක් පන්සියයක් අධ්‍යාපනය ලබනවා. මිට ඉස්සෙල්ලත් මම ඒ ප්‍රකාශය කරා. එතන රිය අනතුරක් පවා සිදුවුනා. ඒක නිසා පාර මාරුවෙන ස්ථානයක් විදියට එතන සලසලා දිලා පොලිස් නිලධාරියෙක්ගේ සේවය යොදවන්න කියලා. මේවෙනකොට ප්‍රධාන පාසල් විශේෂයෙන්ම රාවතාවත්ත මෙතෝදිස් විදුහල, ශාන්ත සෙබස්තියන් විදුහල,වේල්ස් කුමර කුමරි විදුහල අදාල ස්ථාන වල ඒ පාර මාරුවෙන ස්ථාන නම් කරලා පොලිස් නිලධාරින් රාජකාරියේ යොදවලා තියෙනවා. අර කොළඹට කිරි ගමට කැකිරි වගේ අපිට උයන කණිෂ්ඨ විදුහලට ලුනාවට ඒ පාර මාරුවෙන ස්ථානයක් සකස්කරලා දිලත් නැහැ. පොලිස් නිලධාරින් යොදවලත් නැහැ. ඒනිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකරලා ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා ඉල්ලිම කරනවා.

ගරු නගරාධිපතිතුමනි අපේ ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමා කිව්වා වගේ ඉදිරියට එන්නේ වැසිකාලේ. විශේෂයෙන් ලුනාව 6වෙනි පටුමග 7වෙනි පටුමග මේ වැසි ජලයෙන් යටවෙනවා. ඉතින් අපි යෝජනාවක් විදියට ඉදිරිපත් කරා 6වෙනි පටුමග හරහා රේල් පාර හරහා බට නල එලිම. නමුත් දුම්රිය දෙපාර්තුමේන්තුවෙන් තිබ්බ අපහසුතාමත ඒ දේ කරගන්න බැරිවුනා. ඒක නිසා ඔබතුමාට මේ සඳහා ඍජු මැදිහත් විමක් කර එය සලසා දෙනමෙන් ඉල්ලනවා.

**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, අපේ රන්සිරි මන්ත්‍රීතුමා එය කියන කාරණය ඇත්ත. මට පලවෙනි කෝල් එක එන්නේ 5.10ට. දෙවෙනි කෝල් එක එන්නේ හිටපු නාගරික මන්ත්‍රී දිපාල් රෝද්‍රිගෝ 5.29ට ඊට පස්සේ මම 5.37 ට රමේෂ්ට ගන්නවා 5.40ට. නැවත කෝල් එකක් එනවා ඊට පස්සේ මම 5.41ට අලුත් ඉංජිනියට ගන්නවා. ඊට පස්සේ 6.03ට රමේෂ්ට ගන්නවා. මේ ආකාරයෙන් ඊට පස්සේ මට ආයේ පොලිසියෙන් කථාකරනවා. මේ වගේ විශාල ප්‍රමාණයක් කථාකරා. මේක ඔබතුමාට මම පොඩ්ඩක් කියන්නේ ඔබතුමා කියපු කථාව හරි තාක්ෂණිකමය කථාවක්. ඔබතුමා කිව්වේ වෙන්න තියෙන දේ වළක්වන්න පුළුවන් වෙන්න මෙය කරලා ගියානම් අද මෙය වෙන්නේ නැහැ කියලා. ඔබතුමාත් ඔතනට කරදෙන්න බර දෙන්න උරදෙන්න වෙන්න තියෙන දේ වෙන්න යනවෙලාවට පොඩ්ඩක් ඉදලා මේන්න මේක කරන්න මම මැදැහත්වෙනවා. මේක කරන්න කරලා යන්න ඊලග එකත් ඔහොම කරන්න කියලා ඔබතුමා එක දවසක් මැදිහත්වෙන්න. මොකද මේ අපේ තියෙන වුවමනාව මේ කාටවත් නැහැ. ඔබට තියෙන වුවමනාව මේ කාටවත් නැහැ. මට තියෙන වුවමනාව මේ කාටවත් නැහැ. මේ ඔක්කෝන්ටම තියෙන්නේ රාජකාරියක්. අපිට තියෙන්නේ වෙන එකක්. අපි ඔක්කොටම තියෙන්නේ වෙන එකක්. මේ ගොල්ලන්ට තියෙන්නේ රාජකාරියක්. මේක මම හිතනවා ඔබතුමා දවසක් ඔතන ඉදලා

**මහා නගර සභා මන්ත්‍රී - පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, මෝය කැපුවා නම් දවස් 100 ක් 70 කට වඩා සහභාගි වෙලා තියෙනවා.

**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, මම කියන්නේ ඔබතුමා ඉන්නේ නැහැ කියන එක නෙමෙයි. අවසානය වෙනකම් ඉදලා ඔබතුමා යනවා කියලත් මම දන්නවා. අවසාන වෙනකම් ඉන්නවා කියලත් මම දන්නවා. ඔබතුමාට මම මේ කියන්නේ අපිට මේ වුවමනා කරන මේ කාර්යය කරගන්න අවුරුදු 16ක් මට අත්දැකිම තියෙනවා. අපේ වුවමනාව සියයට සියයක් සාක්ෂාත් කරගන්න නිලධාරින් කැමති නැහැ. නිලධාරින් ඒකට එකග වෙන්නේත් නැහැ. ඒක නිසා ඔබතුමා ඊලග දවසේ ඔබතුමා කියන එක හරියට හරි ඔබතුමා කරපු දේ කලානම් මෝය පිරේන්නැතිව කැඩි කැඩිම යනවා. මොකද එතරම් වර්ෂාවක් ඊයේ දිනයේදි පතිතවෙච්ච නිසා මම හිතන්නේ ඉංජිනියර් මේක තමයි වෙන්න ඕන දැන් මේක ඉවරයි දැන් බහිනවා කියන එක නෙමෙයි. හරියටම වතුර ටික බහිනකම් කැපුනාද කියලා බලන්න ඕන. දැන් අද කපන්න යනකොට බුම්

එක යන්න වුනෙත් නැහැ. ජේසිබි එක යන්න වුනෙත් නැහැ. අතින් වැඩේ කරනකොට අඩි 20ක් දක්වා පලල්වෙලා ගලුත් ගලවගෙන ගියා. අද කල්දේමුල්ල4 වෙනි පටුමගින් කථාකරා අවරුදු ගානකට පස්සේ. අද හැම තැනින්ම කථාකරා ධර්මරත්න ඇවනියු එකෙන් කථාකරා. හැම තැනින්ම අද කථා කරන්න ගත්තා. අගුලානේන් පවා කථාකරන්න ගත්තා. රුක්මාල් මන්ත්‍රීතුමා කථාකරේ පහකුත්ගානට කථා කරලා මට කිව්වා මෙන්න මෙහෙම වෙලා තියෙනවා කියලා. එ ඇත්ත එතුමාට කථාකරලා කට්ටිය හතර පස්දෙනෙක් කථාකරලා තිබ්බා. මම කියන්නේ මන්ත්‍රිවරුන්ට උදව්වෙන්න මේ වැඩ සටහන හදනකොට ඒ ගරු මන්ත්‍රීතුමන්ට මේ අත්දැකිම තියෙන්නේ මොකද ඔවුන් එතනමයි ඉන්නේ. විශේෂයෙන්ම අලුත් ඉංජිනේරුතුමා ඔබතුමා මෙයට මැදිහත්භාවයක් ගන්න. අද දිනයේදි මම පහත්බිම් එකේ ගරු සභාපතිතුමත් එක්ක කථාකරා. එතුමා මට කෝල් එකකුත් අරගෙන තිබ්බා. සභාව නිසා මම ගත්තේ නැහැ. එතුමත් එක්ක කථාකළා. එතුමා කිව්වා මේකට ස්ථාවර විසඳුමක් දෙන්න. එතුමා ස්ථාන පරික්ෂාවක් කරන්න එනවා කියලා. මොකද ගල් වැටියක් අපිට අවශ්‍ය වෙනවා. ගල් වැටියේ ඉදලා මේක කපන්න හයයි ජෙසිබි එකෙන් කපනකොට එකපාරටම කැපිලා ආවොත් ජේසිබි එක පෙරලෙනවා. එතරම් අති භයානකයි බලාගෙන ඉන්නකොට පුදුමාකාරයි. ඒක කපනකොට අපිට දිවෙනවා එකපාරටම වැල්ල කඩාගෙන යනවා. එතරම් අති භයානකයි. ජේසිබි එක පවා මුහුදට යන තරම් ලොකු වතුරක් එනවා කලපුව කපනකොට. එතරම් භයානකයි කපපු තැන ඉන්න අයනම් ඒ අත්දැකිම තියෙනවා. මම හිතන්නේ රන්සිරි මන්ත්‍රීතුමාටත් ඒ අත්දැකිම ඇති. එනකොට එන වේගය කොච්චරද කියන එක. එක නිසා මම හිතනවා ඔබතුමන්ලා මේකට මැදැහත්වෙන්න රන්සිරි මන්ත්‍රීතුමා කියන මේ කථාව ඇත්ත. ඇත්ත නැතිව නෙමෙයි හැබැයි ඒකේ වතුර බහින අවසානය දක්වා මේක කරන්න නිලධාරි එතන ඉන්න. ඉදලා ඒක පෙන්නලා ඒ අවසානය දක්වා යන්න දෙන්න. නැතුව බැහැ කරන්න. ඒක මේ අපිට නිදාගන්න නොදි ඉන්නවා නෙමෙයි මිනිස්සු මිනිස්සුන්ගේ කන්නලව්වට ඇහුම්කම් දෙනවා ඉතින් පලවෙනි කෝල් එකෙන් ඉදලා අවසාන එකදක්වාම ඇහුම්කම් දෙනකොට මම හිතනවා 7.20 වගේ වෙනකොට මෝය කට කැපිලා ගිහිල්ලා තිබුණා. ඔක තමයි ඇත්ත තත්වය ගරු මන්ත්‍රීතුමාට පොඩ්ඩක් උදව්වෙන්න.

**03 (20) මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, මීට මාස 6 කට පමණ පෙර මම ඔබතුමාගෙන් මේ සභාවේදි ඉල්ලීමක් කරා රාවතාවත්ත පලවෙනි පටුමග හදලා දෙන්න කියලා. නමුත් ලොකු මුදලක් වැයවෙන වැඩක් ඒවගේම සංවර්ධන ව්‍යාපෘති නතර වෙච්ච නිසා එගැන මම මේ වෙලාවේ බලපෑමක් කරන්නේ නැහැ. නමුත් මේ ප්‍රදේශවාසීන් නැවත නැවත නාගරික කොමසාරිස්තුමා හම්බවෙනවා. ඇවිල්ලා කරදර කරනවා දැන් ඉල්ලන්නේ ඔවුන් එක ප්‍රිමික්ස් කරලා හරි ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියලා.

**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, ඒක තාර දාලා හදන මට්ටමට ගෙනවා. ප්‍රිමික්ස් කරලා හරියන්නේ නැහැ. මොකද ෆර්ස්ට් ලේන් එකෙන් එම්මානුවෙල් පාරට වැටෙන තැන ඉදලා සම්පූර්ණයේ මෙතනට වෙනකම් හදනවා.

**03 (21) මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, මොරටුවේ නගර සභා බල ප්‍රදේශය තුල මේ කාල සීමාවේදි මොරටුවේ ජනතාවට විශාල කරදරයක් බවට පත්වෙලා තියෙනවා. මේ සොර සතුරන්ගෙන් දවාලකට එළියට එන්න බැහැ. ඒ ගෙදරට හොරු ඇවිල්ලා ඒ බඩු භාණ්ඩ අරගෙන යයි කියලා පොල් ගහේ ගෙඩියක් තියන්න බැහැ වත්තට ඇවිල්ලා කඩාගෙන යනවා. එහෙම තත්වයක් අද මොරටුව තුල මේ සොරුන්ගෙන් විශාල ලෙස බලපෑමක් ඇතිවෙලා තියෙනවා. නගරාධිපතිතුමනි මේක කල්දේමුල්ලට විතරක් නෙමෙයි සොයිසාපුරට පමණක් නෙමෙයි මුළු මොරටුවටම අතිභයානක තත්වයක් බවට පත්වෙලා තියෙනවා. අපි සභාවක් විදියට මොරටුවේ මහජන නියෝජිතයො විදියට මේ කරුණට අවධානය යොමු කරලා නගර සභා සීමාවට අවශ්‍ය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරු දැනුවත් කරලා නැත්නම් ජේෂ්ඨ පොලිස් අධිකාරිවරු දැනුවත් කරලා මේකට ගන්නාවු පියවර කඩිනමින් ගන්න කියන ඉල්ලීම මේ සභාවට ඉදිරිපත් කරනවා. ඒක නිසා මෙයට ඔබතුමා මැදිහත්වෙලා අපිවත් මැදිහත් කරගෙන පොලිස් නිලධාරීන් එක්ක සාකච්ඡාවක් දාලා ඉක්මණින් පියවරක් ගමු කියන අදහස මම ඉදිරිපත් කරනවා.

ගරු නගරාධිපතිතුමනි, අනෙක් කාරණය තමයි අපේ රන්සිරි මන්ත්‍රීතුමත් දැන් කථා කරා. ලුනාවේ කලපුව ඔබතුමාටත් කොල් කරලා කිව්වා මටත් 5.30 ට තමයි කෝල් එකක් එන්නේ. නමුත් මම ඔබතුමාට කථාකරේ පහුවෙලා. එතකොටත් ජෙසීබී එක යවලා කිව්වා තියෙන්නේ මම කියන්නේ මේ කාලේ කොහොමත් වැසි ජලයෙන් ලුනාවේ ඇල ඒ දිගට පිරේනවා එතකොට අපේ කල්දේමුල්ල ප්‍රදේශයේ අතුරු පාරවල්වල තියෙනවා කාණු. ඒ වතුර පිරුණාම ඒ අතුරු කාණුවලින් තමයි ගෙවල්වලට වතුර එන්නේ. ආපදාවට ලක්වෙන්නේ ගරු නගරාධිපතිතුමනි ලුනාවේ කලපුවේ ඒ ඇල ගැඹුර මදි .දැන් මේ තියෙන තත්වයට මේ ස්ථාපනය වන වතුර ටික රදාපවත්වා ගන්න මේ ඇලේ ගැඹුර මදි. මේ කාලේ මිනිස්සුන්ට ජීවත්වෙන් හරි අමාරුයි. නමුත් මේ වගෙ ආපදාවක් වුනොත් තවත් මිනිස්සුන්ට අමාරු තත්වයක් එදිනෙදා ජීවත්වෙන මිනිස්සු ඉන්නවා. රැකියාවලට යන ජනතාව ඉන්නවා. ඉතින් ඒක නිසා අපි ආපදාවට ලක්වුනාට පස්සේ  පියවර ගන්නවාට වඩා එකට මොකක් හරි සැලැස්මක් සභාවක් විදියට අපිට කරන්න පුලුවන්නම් අන්න අපි ජනතාවට කරන මේ සභාවෙන් කරන දෙයක් විදියට අපිට කියන්න පුලුවන්. ඒකත් මම ඔබතුමාගේ අවධානය යොමුකරනවා.

ගරු නගරාධිපතිතුමනි, මගේ අනෙක් කරුණ තමයි අගුලාන ආදාහනාගාරය කියන්නේ අපිට සම්පතක්. නගර සභාවට සම්පතක්. ඒ නිසා නගරාධිපතිතුමනි, කල්දේමුල්ල, ලක්ෂපතිය, අගුලාන, තෙලවල, බොරුපන මේ ජනතාවට අසාධාරණයක් අපි කරන්නේ. මොකද අපි රාවතාවත්තට එනවාට වඩා ගල්කිස්සේ යනවාට වඩා අගුලානට යන එක අපිට ලගයි. ජනතාවට එක වාසියක්. ඒ නිසා අඟුලාන ආදාහාගාරය ඉතා ඉක්මණින් ප්‍රතිසංස්කරණය කරලා ඒ ජනතාව අතට පත්කරන්න කියන එක මම මේ අවස්ථාවේදි ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒවගේම කටුබැද්ද වෙළඳපොල අපේ සභාව සතු තියෙන්නේ ගරු නගරාධිපතිතුමනි අපේ රජයේ කාලේ යහපාලන ආණ්ඩුව කාලේ තමයි ඕක හැදුවේ.

**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, කථා කලා සේනක දමයන්ත මහතා කථා කලාට පස්සේ එකට පිළිතුරු දුන්නා. ඒකට කමිටුවක් පත්කරලා තියෙන්නේ.

**03 (22)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. කුමාර රාජරත්න මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කොරළවැල්ල ආසිරි පෙදෙසේ කාණු පද්ධතියට සවිකරලා තියෙන මෝටර් පද්ධතිය සම්බන්ධයෙන් ඒවගේම මම ඒ අවස්ථාවේදි මහජනතාවගේ ඉල්ලීමකට අනුව ඉල්ලීමක් කරා අඩුම තරමේ ස්ථාන පරික්ෂාවක් හෝ සිදුකරලා ඒ අවශ්‍ය කටයුතු ඉක්මණින් සිදු කරන්න කියලා.නමුත් අපේ ජ්‍යේෂ්ඨ නාගරික මන්ත්‍රී ප්‍රදීප් ශ්‍රියන්ත ගරු මන්ත්‍රීතුමා සදහන් කලා වගේ දැන් මේ වැසි සමය ඊයෙන් ආරම්භ වුනා. ඉතින් මම හිතනවා තාමත් මම හිතන විදියට ඒ සම්බන්ධයෙන් පියවරක් අරගෙන තිබුනේ නැහැ. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය නැවතත් යොමු කරන්නට කැමතියි. ඒත් එක්කම ගරු නගරාධිපතිතුමනි, මෙම අයිතමය යටතේ කොරළවැල්ල ධීවර ජනතාව තමන්ගේ ධීවර ගමන් පහසුකර ගැනිම සඳහාත් ස්ථානය හඳුනාගැනිම සඳහාත් ඔවුන් ෆ්ලැෂ් ලයිට් පාවිච්චි කරනවා. මම හිතනවා පහුගිය රටේ තිබ්බ තත්ත්වයත් එක්ක ගොඩක් ෆ්ලැෂ් ලයිට් පත්තුවුනේ නැහැ. යම් යම් අවස්ථාවේදි ඔබතුමාගේත් අනුදැනුම සහ ආශිර්වාදය යටතේ අපේ විදුලි ඉංජිනේරුතුමා හරහා අපිට පුළුවන් ආකාරයට සවිකර අපි ඔවුන්ට සහනය ලබා දුන්නා. නමුත් මේ වෙනකොට ගරු නගරාධිපතිතුමනි, එහි ඉතාමත් අවධානම් තත්ත්වයක් මේ තියෙන තත්ත්වයත් එක්ක තියෙනවා. ඒ නිසා මම හිතනවා අපේ උදව් ඔවුන්ට අවශ්‍ය මොහොතක් මේ තිබෙන්නේ. ඒ නිසා සභාවේ අපිට කරන්නට පුළුවන් ආකාරයෙන් සවිකරලා තියෙන ෆ්ලැෂ් ලයිට් එක්කො ගලවගෙන ගෙනල්ලා ප්‍රතිසංස්කරණයක් අපිට කරන්න පුළුවන්නම්

<u>**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඕක අනිවාර්යෙන්ම ධීවර කාර්යාලවල ලෙල්ලම් තියෙන අය ධීවර සමිතිවල අය දන්නවා ඕක දෙහිවල ධීවර කාර්යාලයට ප්‍රධාන කාර්යාලය දැනුවත්විම කරාම ධීවර කාර්යාලයෙන් දෙනවා. ඒගොල්ලන්ට ඒ අදාල වෙන්නාවූ ෆ්ලැෂර් ලයිට් ඒ දුන්නාම ඒ ෆ්ලැෂර් ලයිට් සවිකිරිම අපිට කරන්න පුළුවන් මන්ත්‍රීතුමා ඒ ලෙල්ලම්වල අයට ධීවර සමිතිවල අයට කියන්න ඉල්ලිමක් කරලා තියන්න කියලා.

**03 (23)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ජුනි මස සභාවේදි මා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියේ එක ප්‍රශ්නයකට පමණයි සවිස්තරාත්මක වගුවක් හැටියට ඒ ප්‍රශ්නාවලියේ පළමු ප්‍රශ්නයට පමණයි පිළිතුරු සැපයුවේ. දෙවන ප්‍රශ්නය සඳහා මේ සභාවේදි ඔබතුමා පිළිතුරු ලබාදෙනවා කියලා ගිය සභාවේදි පොරොන්දු වුනා. මේ සභාවේදි ඒ පිළිතුරු ලබා දෙනවාද කියන කාරණය ඔබතුමාගෙන් පැහැදිලිව අහන්න කැමතියි.

ගරු නගරාධිපතිතුමනි, දෙවන කාරණාව හැටියට එම්මානුවල් චර්ච් පාර මේක මම හිතන්නේ අපේ හිටපු නගරාධිපති රවිනාත් ගුණසේකර මැතිතුමාගේ කාලෙත් පුළුල් කරලා පේමන්ට් දාලා කාණු සකස් කරලා සංවර්ධනය වුණ පාරක් හැටියට තමයි මට මතකයේ තියෙන්නේ. මේ පාරේ වම් පැත්තේ අර අතුරු මාර්ගයේ යන කාණුව. එකේ බැමි ගලවලා ගිහිල්ලා කැඩිලා තියෙනවා කියන එක මතක් කරනවා.ඔබතුමා දන්නවා මේ කාරණාව පෙත්සමක් හැටියට ඉදිරිපත් කරලා තියෙනවා. එහි ප්‍රදේශවාසින් විසින් මේකේ බැමි ගලවලා ගිහිල්ලා කාණුව පටුවෙලා තියෙනවා. ඒනිසා වතුර උතුරලා ගිහිල්ලා අර හරස් පාරේ ඉන්න ජනතාවට විශාල අපහසුතාවයක් එමගින් සිදුවෙනවා. මේ සම්බන්ධව ඔබතුමාගේ සංවර්ධන කටයුතු කරන අවස්ථාවේදි අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03 (24)**<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. ජයමාල් ශ්‍රියාරත්න මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කටුකුරුන්ද ශාන්ත මරියා දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය ලබන 8 වෙනිදාට යෙදි තිබෙනවා. පියතුමා ඉල්ලිමක් කරා ලිපියකින් ඔබතුමාගෙන් අවශ්‍ය කටයුතු ටිකක් තියෙනවා. අපේ ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමාට තමයි ලිපිය එදා යොමු කරේ. ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා නැති නිසා මම එදා ඔබතුමාට ලිපිය යොමු කරා. ඒ වැඩ කටයුතු ටික ගැන පොඩ්ඩක් බලලා අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, විදුලි අංශයේ කටුකුරුන්ද ප්‍රදේශයේ වැඩ කරන සේවකයා දැන් දවස් තුනකට උඩදි යද්දි එක්කෙනෙක් යම් පැමිණිල්ලක් කරලා තියෙනවා එයාගේ ගේ ගාව ලයිට් එකක් දාලා දෙන්න කියලා .ඒවෙලාවේ ප්‍රකාශ කරලා තියෙනවා වැඩෙ කරන්න පුලුවන් මන්ත්‍රීතුමා කියලා තියෙනවා දාන්න එපා කියලා. එහෙම කියලා තියෙනවා. ඒ මනුස්සයා අපේ ගෙදරට ඇවිල්ලා තියෙනවා. මට ගහන්න

ආවාද කොහොමද දන්නේ නැහැ. අපේ ගෙදර කවුරුත් හිටියේ නැහැ. එයාගේ මල්ලි කෙනෙක් ටෙලිෆෝන් කරලා මට කිව්වා මෙන්න මෙහෙම වැඩක් වෙලා තියෙනවා "ඔයගොල්ලන්ගේ සේවකයා තමයි කියලා තියෙන්නේ. ඔයා එපා කිව්වා" කියලා එතකොට තමයි මම දන්නේ එතනට ලයිට් එකක් ඉල්ලා තියෙනවා කියලා. ඒනිසා එගැන සොයා බලලා පරීක්ෂණයක් හරි කරන්න පුලුවන්නම් හොඳයි කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද විටින් විට ඒ මනුස්සයා මාත් එක්ක ගැටුම් ඇතිකරගත්ත මනුස්සයෙක් මම ඉතින් ඒ මනුස්සයාට විරුද්ධවුනේ නැහැ. එතනට ඇත්තටම ලයිට් එකක් අවශ්‍යයි පුලුවන්නම් ඒ සේවකයා ගෙන්වලා එහෙම කිව්වේ ඇයි මීටත් කලින් ඔහොම එකකුත් සිදුවුනා. දෙවෙනි වතාවටත් සුදුවුනා තුන්වෙනි වතාවේ මට ඇවිල්ලා ගහයිද දන්නේත් නැහැනේ. මිනිස්සු දකින දකින වේලාවටව ඕක කියන නිසා අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**03(25)**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ තිලකසිරි මන්ත්‍රීතුමා මට කලින් ඒ කාරණය කථා කරා. වඩුකර්මාන්තය සම්බන්ධව දැවෙන ප්‍රශ්නයක්. ඉතින් අද දවස වනවිට මමත් කුඩා කල ඉඳන් මගේ නිවසේත් වඩු කර්මාන්තය කරේ. මම හාඩ්වෙයාර් එකක් එකදිගට අවුරුදු 5ක් පැවැත්තුවා. අද දවස වෙනකොට හාඩ්වෙයාර් කර්මාන්තයත් එක්ක බලද්දි දැව කර්මාන්තයත් එක්ක බලද්දි ජීවන තත්වය පහතට වැටිලා තියෙනවා විශේෂයෙන්ම මොරටුව. විශේෂයෙන්ම අවධානය යොමු කල යුතු ප්‍රශ්නයක් ඔබතුමාගේ අවධානයට යොමුකරන්න ඕන ප්‍රශ්නයක්. මම විශේෂ ඉල්ලීමක් කරන්න කැමතියි දැව කර්මාන්තය ආශ්‍රිතව ඇති ප්‍රශ්න ගැටලු හඳුනා ගැනීම සඳහා විශේෂ කමිටුවක් ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් මොරටුවේ අදාල අංශ සමග සාකච්ඡා කිරීමට අවශ්‍ය පසුබිම සකසන්න කියලා මොකද අදවෙනකොට මොරටුමුල්ල ප්‍රදේශයේ පිරිස රැකියා විරහිත පිරිස් බවට පත්වෙලා තියෙනවා. රට අත්හැරලා යන්න,පිට රටවල විදේශගතවෙන්න අවශ්‍ය පුසබිම සකසා ගන්න උත්සාහ කරනවා. ඉතාම සෝචනීය අවස්ථාවක්. විශේෂයෙන්ම මමත් වඩුවෙකුගේ දුවෙක්. අවුරුදු 8 ඉඳලා මම මගේ තාත්තාගේ කර්මාන්තයත් එක්ක ජීවත් වෙච්ච කෙනෙක්. ඉතින් ඇත්තටම මගේ හිත ඇතුලෙන්ම වේදනාවක් තියෙනවා මම හැදිච්ච මම වැඩිච්ච කර්මාන්තය නැතිවෙනවාට මම කැමති නැහැ. ඉතින් මට ඕන මේ කර්මාන්තය කිසියම් ස්ථාවරත්වයක් කරා ගෙන එන්න. ගරු නගරාධිපතිතුමනි ඒ සඳහා අපි එකතුවෙලා කිසියම් වැඩ පිළිවෙලක් හදමු. පක්ෂ පාට දේශපාලනයෙන් තොරව විශේෂයෙන්ම මොරටුවට ආවේණික වෙච්ච කර්මාන්තය අපි ආරක්ෂාකරගන්න ඕන. ඉතින් හිත ඇතුලේම ලොකු වේදනාවක් තියෙනවා මිනිස්සුන්ගේ ප්‍රශ්න අහන කොට එදිනෙදා ප්‍රශ්න ප්‍රමාණය වැඩි වෙනවා. මම ගෞරවයෙන් අවධානය යොමු කරන්න කැමතියි අපි පක්ෂ වශයෙන් නැතිව අපි හැමෝම එකතුවෙලා පුලුවන්නම් අපේ කර්මාන්තය ආරක්ෂාකරගන්න පසුබිම සකසාගැනීමට අදාල කමිටුවක් ඔබතුමා නිර්දේශ කරන්න. ඒ සඳහා අපිව යොමුකරන්න කියන ඉල්ලීම කරනවා.

**03 (26)** <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් අපි ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. ඒතමයි අද වෙනකොට සමස්ථයක් විදියට මේ සභාවේ මතුවෙච්ච කාරණාව තමයි අපි එදා ලී කොට හැඩ දාලා යතු ගාපු වඩු කාර්මිකයො අද අතුගැවිලා තියෙනවා. එත් එක්කම අනෙක් පැත්තෙන් දියඹට ගිහිල්ලා දැල දාපු ඒ ධීවරයෝ ටික අද වෙරළේදීම දැලට අහුවෙලා තියෙනවා එවගේම භූමිතෙල් ප්‍රශ්නය මිල ඉහල යාම මෙවැනි ප්‍රශ්න නිසා. ඒ නිසා අනෙක් පැත්තෙන් බෙහෙත් ටික ගන්න ඒ ඉස්පිරිතාලේ බෙහෙත් පෝලිමට යන මිනිස්සුන්ගේ ඒ සුවතාවය වෙනුවට තමන්ගේ තියෙන බෙහෙත් නොලැබේය කියන මානසික පීඩනයට පත්වෙලා තියෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඔබතුමත් හැමතිස්සේම කියන එකක් තමයි සභාවේ මතුවුන විදියට නගරාධිපතිතුමාට නගරාධිපතිතුමාගේ තියෙන බලතල අනුව පිච් එකේ බැට්කරන්න පුලුවන් කියලා ඒත් සමහර වෙලාවට පිච් එකේ බැට්කරන්න පුලුවන් ඒ අවස්ථාව සමහර වේලාවට ඔබතුමා නිදැල්ලේ යවනවාද කියන එක මට ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා මම ගරු ඔබතුමාට අවධානය යොමුකරනවා ඒ නගරාධිපති බලතලත් එක්ක සභාවේ බලතලත් එක්ක පිච් එකේ බැට් කරන්න පුලුවන් අවස්ථා නිදැල්ලේ යවන්න එපා කියලා. ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ මම අවධානය යොමු කරන්න කැමතියි මේ සමස්ථ ප්‍රශ්න වඩු කාර්මිකයාට වේවා, අද ඔවුන් බුන්වත්වෙලා ඉන්නේ ඒවගේම ධීවරයා බුම්බත්වෙලා ඉන්නේ. කම්කරුවා මොරටුවේ බුන්වත්වෙලා ඉන්න අතරවාරේදි අනෙක් පැත්තෙන් අපි සභාවක් විදියට තවත් බලපාන ප්‍රශ්නයක් තමයි මොරටුවේ තියෙන දරිද්‍රතාවය. ඒවගේම රැකියා වියුතක්තභාවය එන්න එන්නම වැඩිවෙනකොට ගෙවල්වල තියෙන

අගහිගකම් වැඩිවෙනකොට මන්දපෝෂණ තත්වය වැඩිවෙලා තියෙනවා. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරනවා අපි මේ සභාවේ මේ වසරට විතරක් ලක්ෂ 22කට ආසන්න මුදලක් අපි වෙන්කරලා තියෙනවා. ලෝක බැංකු ආධාර වලින් තාමත් ක්‍රියාත්මක වෙන ආයතන තියෙනවා. ඒවගේම සර්වෝදය වගේ ආයතන තියෙනවා එකතු කරලා මේ මොරටුවේ ඉන්න අපිට උදව් කරන්න පුළුවන් අහිංසක දරුවෝ මම මීට පෙරත් අවධානය යොමු කලා තමන්ගේ අම්මා තාත්තා නැති දරුවෝ පවුල් 80ක් විතර මේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලියාපදිංචිවෙලා තියෙනවා. අද ඔවුන්ගේ ගෙවල්වල බතක් ඉදෙන්නේ නැහැ. මම මීට පෙරත් කිව්වා සමහර ගෙවල්වල කොස්ඇට තමයි තමන්ගේ බඩවේල බවට පත්වෙලා තියෙන්නේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ බලතලත් පාවිච්චි කරලා නිදැල්ලේ යන්න නොදී මේ සියලු ආයතන එකට එකතු කරලා මම ප්‍රධාන ඉල්ලීමක් කරනවා අපිට කම්යුනිටි කිචන් කියන සංකල්පය ගෙන්න පුළුවන්නම් එක තැනකට පාසලකට හෝ පෙර පාසලකට හෝ ඒ දුරිදතාවයෙන් ඉන්න මිනිස්සුන්ට අපිට මේ පොදු කුස්සිය එහෙම නැත්නම් කම්යුනිටි කිචන් කියන සංකල්පය මේ ආයතනත් එක්ක එකතු වෙලා ගෙනල්ලා මන්දපෝෂණය තුරන් කරන්න අර අපි වෙන්කරලා තියෙන ලක්ෂ 22 මුදල ප්‍රමුඛතා අඳුනගෙන යොදවන්න කියන එක මම ඉතාමත් ගෞරවයෙන් පළවෙනි කාරණය විදියට ඉල්ලනවා.

ගරු නගරාධිපතිතුමනි, අද මේ සභාවේ මන්ත්‍රීවරු කථාකරපු ප්‍රශ්නවලට අපි මේ වෙනකොට කොහොමද මුහුණ දෙන්නේ මේ ප්‍රශ්නවලට මුහුණදෙන එක විද්‍යාත්මක වෙන්න ඕනෑ. මේ ප්‍රශ්නවලට මුහුණ දෙන එක කළමණාකරන ක්‍රම වලට එකගවෙන්න ඕන. ඒ නිසා අද ඕනෑ තරම් රටේ ලොකේ නව ප්‍රවනතා තියෙනවා කළමනාකරණ තීන්දු නව තාක්ෂණික ක්‍රම තියෙනවා. අපි මේවා පාවිච්චි කරනවාද මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි යෝජනාවක් විදියට මේ මොරටුවේ තියෙන ප්‍රශ්නවලට පිලියමක් විදියට මේ සියලු ආයතන ආපදා කළමණාකරන ආයතනය හෝ වේවා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හෝ වේවා අනෙකුත් ආයතන එකතුවෙලා මොරටුවේ කාර්යසාධන බලකායක් හදන්න ඕනෑ. පලවෙනි එකතමයි අපි පහුගිය කාලේ මාසේට පාරක් තිබ්බා සංවර්ධන කමිටුව අද සංවර්ධන කමිටුව පැවැත්වෙන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා අපිට පුළුවන්නම් මේ මොරටුවේ වගකිවයුතු ආයතන එකතු කරලා රාජ්‍ය මට්ටමින් කාර්යය සාධන බලකායක් හදලා මොරටුවේ ප්‍රශ්නවලට අපි මුහුන දෙන ප්‍රමුඛතාවය මොකක්ද කියලා අපිට හඳුනගන්න පුලුවන් එකට ඕන තරම් කළමනාකරණ ක්‍රම තියෙනවා. ඒ අනුව ඔබතුමා ක්‍රියාත්මක වෙන්න. ඒ සඳහා අවශ්‍ය කරන අපේ සහයෝගය ඒවගේම ඵලදායිතා සංකල්ප මේ ඔක්කොම එකතු කරලා අපිට කරන්න පුළුවන්. ඒ ප්‍රමුඛතා තෝරන කොට අද ඕන තරම් තියෙනවා ක්‍රමවේද. ඒතමයි ඉෂිකාවා චක්‍රය කියනවා, හේතුඵල වාදය බුදුහාමුදුරුවෝ අනුවත් හේතුඵල න්‍යාය තියෙනවා. එත් එක්කම සමහර ප්‍රශ්න තියෙනවා අපිට එවට විදේශියවත් දේශිය තියෙන ආයතන වලත් සහභාගීත්වය ගන්න පුළුවන්. ඒවගේම තමයි අපි නගර සභාව විදියට ගත්තාමත් යම් විදියකින් වෙනස් වෙන්න ඕනෑ. ඒතමයි මම ඊයේ ගියා විශේෂයෙන්ම අපේ නගරසභාවත් එක්ක පාලනය වන ඉතාමත් හොඳ මට්ටමක තියෙන විද්‍යාල මාවතේ තියෙන දන්ත ශල්‍යාගාරයට. ඉතාමත් හොඳින් කරගෙන යන ආයතනයක් අපි පහුගිය කාලේ එක ගරා වැටිලා තියෙන කොට විශේෂයෙන් චම්පික රණවක ඇමතිතුමාට කියලා මට පුළුවන් වුනා ලක්ෂ 10ක මුදලක් ගෙනල්ලා එක නවීකරනය කරන්න. හැබැයි අපිට තියෙන ප්‍රශ්නය තමයි ඒ වෛද්‍යතුමිය ඉන්න තැන බල්බ් එක ගිහිල්ලා හෝල්ඩරයත් ගිහිල්ලා. ඊට පස්සේ අදවෙනකොට ලියුම් කිහිපයක් එතුමිය යොමු කරලා තියෙනවා. ඒ ලියුම් යොමුකරන කොට මම කියන්නේ ලියුම ලියන ක්‍රමය නැතිව අපිට පුලුවන්නම් එතුමිය යම් පණිවිඩයක් දුන්නොත් එහෙම මේ ප්‍රශ්නය හඳුනගෙන වැඩ පත්‍රිකාවක් සකස් කරන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, සාමාන්‍ය හැම වේලාවේම ඔය වගේ කාරණා ආරංචි වෙනවා. ඔබතුමාලා මතු කරනවා දැන් ආසන්නම උදාහරණය තමයි ගිය සභාවේ අපේ සුදර්ශණී මන්ත්‍රීතුමිය මතු කරා වතුර නැහැ උයනේ කියලා. දැන් අවුරුද්දක් තිස්සේ කියලා. එතකොට අපි එක ගිය සෞඛ්‍ය කමිටුවේත් සාකච්ඡා කරනවා. නමුත් මොරටුව නගර සභාවට එහෙම දැනුම්දීමක් කරලාම නැහැ. කවුරුවත් එහෙම දන්නේ නැහැනේ. ඔබතුමාට පුලුවන්නම් ඒ ලිපියේ පිටපතක් එක්ක හරි ඉදිරිපත් කරන්න. මෙන්න මේ ලිපිය ඉදිරිපත් කරලා තියෙනවා කියලා. අපිට හරි වැදගත් හැබැයි හොයලා බලනකොට එහෙම ලියුමක් මම විදුලි අධිකාරිගෙන් ඇහුවා එහෙම ලිපියකින් අපිට දැනුම් දීලා නැහැ ප්‍රදේශයේ මන්ත්‍රීතුමාට දැනුම් දෙන්න. එහෙම නැත්නම් නාගරික කොමසාරිස්තුමාට දැනුම් දෙන්න ඕනෑ. එහෙම නැතුව අපිට නිවැරදි ආකාරයෙන් දැනුම් නොදී ඔබතුමාලා ගියාම එහෙම කිව්වාම වෙන්නේ ඔබතුමාලා සභාවේ කියනවා. මේක වැරදි පණිවිඩයක්

සමාජගතවෙනවා. මම කියන්නේ නැහැ ඔබතුමා බොරු කියනවා කියලා. ඔබතුමා ඇත්ත වෙන්නැති කියන්නේ මේක නිවැරදි විදියට කරෝත් අපිට පුලුවන් මේවා නිවැරදි කරගන්න. ඒනිසා ඔබතුමාලා ඉදිරිපත් කරනකොට අපිට හරි පහසුවක් ඒ ලිපියේ පිටපතක් ඉල්ලගෙන ඇවිල්ලා ඉදිරිපත් කරෝත් අපිට ඒ අවශ්‍ය ක්‍රියා මාර්ග ඒ නිලධාරින්ගෙනුත් අහන්න පුලුවන් මෙච්චරකල් මොකද මේක නොකලේ කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,අපිට තියෙන කලමණාකරන ප්‍රතිපත්තිත් එක්ක වැඩ පත්‍රිකාවක් සකස්කරගන්න පුලුවන්නම් අපේ ඉන්න නිලධාරියා ලියුම් දෙන්න ඕනද කැඩෙන කැඩෙන පාරට අපිට පුලුවන්නම් අපිට කමියුනිටි ඉම්පෘමන්ට් එකක් විදියට පුලුවන්නම් වැඩ පත්‍රිකා සකස් කරලා කටයුතු කරමු.ගරු නගරාධිපතිතුමනි අපිට සුලුවැඩකරගන්න මෙන්ටනන්ස් යුනිට් එකක් හදනවා. අපිට පුලුවන්නම් කෝල් කරලා කියන්න වැඩ පත්‍රිකාවක් අනුව ඒ වැඩ පත්‍රිකාවේ සදහන් කරනවා මෙන්න මේ මේ වේලාවෙ මේක ඉදිරිපත් කරලා තියෙනවා කියලා ගිහිල්ලා හැදුවට පස්සේ අපිට පුලුවන්නම් මොනවා හරි හෝල්ඩර් එකක් හරි දැම්මානම් මොකද මේගෝල්ලො වගකියන්න ඔනනේ ඒ ආයතන වල

සභා ඝෝෂා

ගරු නගරාධිපතිතුමනි සෞඛ්‍ය සේවකයන්ගේ පැත්තෙන් ගත්තාට පස්සේ පහුගිය කාලේ ඒ කියන්නේ සති දෙකකට තුනකට ඉස්සේල්ලා අපේ සේවකයෙක් එහෙම නැත්නම් ට්‍රැක්ටර් රියදුරෙක් ට්‍රැක්ටරයෙන් යන අතවාරේ වැටිලා අසනිපවෙලා ඔහු කලුබෝවිල රෝහලේ රෝහල්ගත කරා. ඒවගේම යන කොට අවසාන වශයෙන් අපිට නිගමනයකට එන්න වෙන්නේ ඔහුගෙ සිනි මට්ටම අඩුවෙලා නිසා මම අවධාරණය කරනවා ගරු නගරාධිපතිතුමනි අපේ සෞඛ්‍ය කදවුරු පැවැත්වෙනවා හැබැයි අපිට යම් නිශ්චිත ප්‍රමාණයක් අවුරුද්දකට වතාවක් හෝ දෙවතාවක් සමස්ථ සේවකයන්ට ඒ කරන සෞඛ්‍ය පරික්ෂණ පවත්වන්න ඕන රියදුරන්ට අඩුම තරමේ මාස හයකට වතාවක්වත් ඔවුන්ගෙ රුධිර මට්ටම රුධිරයේ සිනි මට්ටම මේවා පරික්ෂා කරලා ඔවුන්ට නිශ්චිත වැඩ සටහනක් ක්‍රියාත්මක කලයුතුයි වැඩ සටහනක් යනවා අනිවාර්යය කලයුතුය කියන එක මම ඉතාමත් ඕන කමින් යෝජනා කරනවා. ඉටු කරන්න සේවකයන්ට තෘප්තිමත් කරන්න මේක ඉතාමත් ගෞරවයෙන් යුක්තව ඉල්ලා සිටිනවා. එත් එක්කම අද වෙනකොට සෞඛ්‍ය සෙවකයන්ට ඕන කරන පහසුකම් අපි එක මුදල් කමිටුවේදි කථාකරන්නම් එත් එක්කම අනෙක් පැත්තෙන් සබන් කැටය පවා මේවෙනකොට නොලැබෙන මට්ටමක් තියෙනවා. එක ඉටු කරන්න කියන එක ඉතාමත් ගෞරවයෙන් යුක්තව ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි,මම හිතනවා තමන් කියන දේ සමාජගත කරන්න වුවමනාවක් තියෙනවා නම් ඒ සමාජගත කරන්න වුවමනා වන අවසරය කරුණාකරලා ලබාගන්න. මෙය තමන්ගේ ප්‍රකාශන අයිතිය අහෝසි කරන කටයුත්තක් නෙමෙයි. මෙය සභාවක් ඒ සභාවට කටුයතු කිරිමේදි අපි ගොඩාක් දෙවල් නිවැරදි කරන්න යන විට නිවැරදි කරන්න ඕනැ තැන නිවැරදිකරන් නැති එකේ ලොකු ප්‍රශ්නයක් තියෙනවා. මහා විනාශයක් කිව්වාට මුලික වුනේ ඕකම තමයි. ඒ විනාශය නවත්වන්න තියෙන එකම දේත් එකම තමයි. වෙන මුකත් නැහැ. ඒ නිසා කරුණාකරලා භාෂණ අයිතිය ගන්නට ඕනේ ආචාරධර්ම පද්ධතිය යටතේ එකත් එක්ක අපි ගමු.

03(27) **<u>මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ දවස්වල විශාල ප්‍රශ්නයක් තියෙනවා. හැම තැනම අපේ වතුර කපනවා රු.5000 බිලටත් කපනවා. මේ ඉරිදා පත්තරයේ තියෙනවා මැති ඇමතිවරුන්ගේ ජල බිල්පත් මිලියන ගණන් එවට මොනවත් නැහැ. ඔබතුමත් මමත් අපි කවුරුත් නියෝජනය කරන හැම තැනම ඉංජිනියර් හොදයි කලින් නිමල් මහත්තයා ඉන්න කාලේත් හොදයි දැන් ඉංජිනියර් මහත්තයාත් හොදයි. අපි කිව්වාම යමක් කරනවා නමුත් එන නිලධාරින් සතපහකට ගණන් ගන්නේ නැහැ. අපි කියන එකක්වත් කථාකරත් ෆෝන් එක උස්සන්නේ නැහැ. ඉහලින් එන ඕඩරයක් කියලා කියනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඊයේ දිනයේදි මගේ ගෙදර කපන්න ඇවිල්ලා ගෙවලා තියෙන බිල ඉදිරිපත් කරලා තමයි බේරුනේ. මේවා මම හිතනවා අපි අතින් වැරදිම් වලින් වන ඒවයි අපි හිතාමතාම නොගෙවීම තුල වෙන ඒවායි කාරණා ගොඩාක් තියෙන්නට පුලුවන්. දැන් වතුර නැතිව විදුලිය නැතිව දැන් මාස 4ක් වෙනවා මේ 9වෙනිදාට. ඒක නිසා මම හිතනවා එනිසාම මගහැරුණා බිල් ගෙවන්න එවැනි තත්වයන් තියෙනවා. එකම දේ අපි එක කල්පනාකරනකොට අපි ඇඟිල්ල දික්කරන්න යන්නේ අපේ ම ලොකු අයට ඊට වඩා හොදයි මම හිතන්නේ මේකේදි බිල වැඩිනම් අපි ෆයිට් කරමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කියන්න යන්නේ ඒක නෙමෙයි මිනිස්සු අහන්නේ ඕක නෙමෙයිනේ. මිනිස්සු අහන්නේ ඔයගෝල්ලන්ටත් එහෙමද කියලා. අපිටත් ඔහොමද අපේ කපන්නේ නැද්ද? අපේ විතරද කපන්නේ ඒ පත්තරය පෙන්නුවා ලොකුවට කථාකරනවා ටිවි එකේ උදේ පාන්දරට කියනවා මේ දවස්වල අපේ මිනිස්සු නන්නත්තාරයි වඩු කාර්මිකයෝ. මම කථාකරා ඒ වේලාවේ මරණයක් වෙලා තිබ්බා. ඒවේලාවේ මම හිටියා යන්න ලැස්තිවෙලා මම ගාල්ලේ යන්න ලැස්තිවෙලා හිටියේ. ඉතින් ඒ වේලාවේ කථාකරාට පස්සේ නිලධාරිතුමිය සතපහකට ගණන් ගත්තේ නැහැ. මම විශ්වගේ මහත්තයාට කථාකරාම ෆෝන් එක දෙන්න කිව්වාම ෆෝන් එක ගත්තේත් නැහැ. එයාට ඉහලින් ආව ඕඩරයක් කියලා මරණයක් සිදු වු වේලාවේ ඒවගේ ඉල්ලීමක් කරාම නොකරනවානම් අර මනුස්සයා අහනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න හොරු කියලා කෙලින්ම කිව්වේ. අපෙන් අහනවා ඇයි එහෙම කරන්නේ කියලා. ඔයගෝල්ලො මැදිහත්වෙන්නැත්තේ ඔයගෝල්ලන්ටත් මේ බිල්වල චාන්ස් එක දෙනවාද කියලා. විශ්වගේ මහත්තයා සොරි කියලා කිව්වා හැන්දෑවේ අරගෙන. එයා මිටින් එකක කියලා හිටියේ. අන්න එවගේ තත්වයක් ඔබතුමා ප්‍රධාන පුරවැසියා වශයෙන් අපි හැමෝමත් සමාජ සේවකයෝ වශයෙන් පොඩ්ඩක් මැදිහත්වුනානම් හොදයි මොකද 4000,5000ටත් කපනවා කියන්නේ හරිම කණගාටුදායක තත්වයක්. වඩුවො නන්නත්රා වෙලා ඉන්නේ,ධිවරයා නන්නත්තාරයි දැන් වැස්සක් ආවා අනෙක් සියලු දේ ඉවරයි. අඩුගානේ යම් ක්‍රමයක් හැදුවානම් ඉස්සර නිමල් මහත්තයා ඉන්නකොට ඔබතුමා දන්නවා ඒ ඉංජිනියස්ලා හරි හොදයි. විශ්වගේ මහත්තයාත් හරි හොදයි. නමුත් එගෝල්ලන්ට පරිභාහිරව ඉන්නවා ඉහලින් එන ඕඩරයක් කියලා තමයි මේ හැමෝම එන්නේ. ආවාම වතුර කපන්න එන මනුස්සයත් ඒහැමොම එන්නේ කොන්ත්‍රාත් පදනමනේ තියෙන්නේ. ඒගොල්ලන්ගේ ගණන් හරි ඉහල මට්ටමේ තියෙන්නේ. ඒගෝල්ලෝ කථාකරන්නවත් දන්නේ නැහැ. සමහර අය මම හිතන්නේ ඕකට පොඩි මැදිහත් විමක් වෙලා යම් කිසි දෙයක් කරානම් හොදයි. අර මිනිස්සු අහන දේවලට අපිට උත්තර නැහැ.

**03 (28) <u>නියෝජ්‍ය නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ අවස්ථාවේ මම කරුණක් මතු කරනවා. මම හිතන්නේ ඔබතුමාටත් ඒවගේම අපේ නිලධාරින් සියලු දෙනාත් විශේෂයෙන් ඉංජිනියර් මහත්මිය මොරටුව කොරළවැල්ල පොල්වත්ත ක්‍රිඩාපිටියේ මේවන විට පොල්ගස් 6ක් විතර අකුණු සැර වැදිලා දැන් අවුරුද්දකට වැඩි කාල සිමාවක ඉදලා මේ ගස් ටික නිකම් තියෙනවා. දැන් මේක ඇත්තටම අවධානමක් තියෙනවා යම් අවස්ථාවක කාගේ හරි ගේකට හරි කඩන්වැටිලා මොනවාහරි විපතක් සිද්ධවුනොත්. ඒනිසා මේක මාධ්‍යය හරහා ගිහිල්ලා අන්තිමේට නගර සභාව මේවගේ දෙයක්වත් කරේ නැහැ කියන ප්‍රශ්නය අපි දාගන්න ඕන නැහැ. විශේෂ අවධානය යොමු කරලා මේ ගස්ටික කපා ඉවත් කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලිම කරනවා. ගස් 6ක් විතර ඒ පොල්වත්ත ක්‍රිඩා පිටියේ මේවනවිට අකුණුසැර වැදිලා සම්පුර්ණයෙන් විනාශවෙලා තියෙනවා. මොකද පොඩි ළමයි විශාල වශයෙන් එහි ගැවසෙනවා. මේ ගස් කඩා වැටුනොත් එකක් හරි කාගේ හරි ඇගකට වැටුනොත් මිය යන්න ඉඩ තියෙනවා. ඒවගේම නැවතවතාවක් සභාවේ ගොඩක් දේවල් කථාකරනවා. නමුත්, සිද්ධවෙන ප්‍රමාණය ඉතාම පොඩි ප්‍රමාණයක් තමයි සිද්ධවෙන්නේ .නමුත් අපි ඔයට කලින් ඉදිරිපත් කරාම සභාව ඉදිරිපිට කහ ඉරක් දාන්න කියන එක. ඒක සිද්ධවෙලා තිබුනේ නැහැ. ඒවගේම දැන් ගිය සභාවෙත් මම මතු කලා ගරු නගරාධිපතිතුමනි වෙරල තිරය සහ මේ මොරටුවේ දකුණු කලාපයේ විශේෂයෙන්ම මුහුදු පින්න එන නිසා විදි ලාම්පු කඩන්වැටෙන ප්‍රමාණය වැඩියි මාස 6ක් වගේ තියෙන්නේ මේක ගිය සභාවෙත් ප්ලාස්ටික ලාම්පු ටික හදන්න කියලා විදුලි අධිකාරිගෙන් මම ඇහුවාම එතුමා කිව්වා මේක සප්ලයි අංශයට දිලා තියෙන්නේ සැපයුම් අංශයෙන් තාම බඩු ටික ගෙනත් දෙන්නේ නැහැ කියලා.

**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, ඊයේ තමයි අත්සන ගත්තේ.

**නියෝජ්‍ය නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, එහෙනම් එකත් ලොකු දෙයක් මා අගය කරනවා. ඉතින් ඒවගේ මදුරු ප්‍රශ්නයත් විශාල වශයෙන් තියෙනවා. ගිය සභාවේත් මම කථාකරා මේවට මොකක්හරි විකල්පයක් යොදවලා මොකද වෙන්නේ කියලා. ඇත්තටම විශේෂයෙන්ම නගරාධිපතිතුමා කාණුවලින් තමයි මදුරුවො බොවෙන්නේ. නැත්නම් ගෙවල්වල කට්ටිය ගොඩක්දුරට අද සමාජ දියුණුවත් සමග බොහේදුරට මදුරුවො නේවාසිකව බෝවෙනවා අඩුයි. විශේෂයෙන්ම පිළිගන්න වෙනවා අද මිනිස්සු වෙනදාට වඩා දියුණු මට්ටමක ඉන්නවා. දැනුවත් කිරිම් හරහා. කාණුවල තමයි ප්‍රධාන වශයෙන් නව ගාලුපාරේ තියෙන කාණු පද්ධතිය ඒවගේම අපේ කාණුවලත් ඔබතුමාට ගිහිල්ලා පෙන්නන්නම් ෆොටොස් ඊයේ පෙරේදාත් එව්වා. අර වෙරළ මෝය කපනවා වගේ තමයි මේදවස්වල හැම කාණුවම මුහුදට යන හැම කාණුවක්ම වැහෙනවා. මේ වෙනකොට ඒ කාණුව සම්පූර්ණ මුහුදට සිමාවට කඩලා ගිහිල්ලා කොන්ක්‍රිට් බැම් පවා කැඩිලා ගිහිල්ලා තියෙනවා. ඉංජිනේරු මහත්මියට අවස්ථා ගණනාවකදි ලියුම් යැව්වා. මේක පොඩ්ඩක් බලලා පොඩි ප්‍රමාණයයි තියෙන්නේ. ලැලි ටිකක් ගහලා කොන්ක්‍රිට් ටිකක් දාලා අපේ සේවකයෝ යොදවලා අන්න ඒවගේ වැඩ ටිකක් තියෙන්නේ. ඒනිසා අතන විශාල වශයෙන් වතුර රැදෙන කොට මුහුද වැලි ගොඩ දැම්මාට පස්සේ ලොකු ලිදක් වගේ හැදෙනවා. ඉතින් මෙතන විශාල වශයෙන් මදුරුවො බෝ වෙනවා ඒකට අපි වගකිමක් දරන්න ඔනනේ. ඒනිසා ඒවගේ අවස්ථාවල විශේෂයෙන් මම දැක්කා ඔබතුමා ගෙනල්ලා තියෙනවා අර ජල සම්පාදන මණ්ඩලයේ විශාල බෝක්කු අන්න ඒවගේ දෙවල් ප්‍රයෝජනයට ගමු. ඒවා දාලා මේ හානිය සමාජ විපතක් මේකෙන් සිද්ධවෙන්නේ ඒනිසා ඒක අවම කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා නැවත වතාවක් සිහිපත් කරනවා.

**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, කොමසාරිස්තුමා නැවත නැවත මේවා කථාකරන්න වෙලා තියෙන කාරණයක් ඊලග සභාව තියෙන්නේ පලවෙනි බ්‍රහස්පතින්දා සදුදා හෝ බ්‍රහස්පතින්දා තමයි පොඩ්ඩක් ඇගට දැනෙන්නේ සභාව කියලා. මේක තමයි නිලධාරින්ට කොහොම කියන්නද කියලා මට තේරෙන්නේ නැහැ. නමුත් මම හැම තිස්සේම කියනවා දැන් ඔබතුමා ලියා ගන්න එක ක්‍රියාත්මක කරන්න හෙට. හෙට පටන් ගන්න ක්‍රියාත්මක කරන්න. දැන් නියෝජ්‍ය නගරාධිපතිතුමා කිව්ව කාරණය ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමා කිව්ව කාරණය ඒ කාරණයේදි පැහැදිලිවම උපදේස් දුන්නා. ඔය බට ටික ගෙනියලා බටේට සම්බන්ධකරලා ටික දුරක් ගෙනියලා ගල් වැටියක් දාන්න. එතකොට එන්නේ ධිවර එකෙන්නම් ධිවර එකට කියනවා එහෙනම් ඔයගොල්ලෝ කරලා දෙන්න කියලා. ඒක පහත්බිම් එකෙන්නම් කරන්නේ කරන්න එපා කියලා එහෙනම් ඔයගොල්ලෝ ඩිසයින් එක දෙන්න කියන්න ඔන. එහෙම කියන්නේ නැතිව අපේ ප්‍රශ්න අපි විසදගන්න අපිට පුළුවන් වෙන මට්ටමට ගියේ නැත්නම් මේ විසදුම එන්නේ නැහැ. දැන් කරුණාකරලා මේ මන්ත්‍රිවරු පාට මොකක්ද නෙමෙයි මේ මන්ත්‍රිවරු කියපු දෙවල්වලින් අපේ පැත්තෙන් ඉක්මණටම කරන්න පුළුවන් උප නගරාධිපතිතුමා කියපු දේවල් වලට මහා කාලයක් යන්නේ නැහැ කරන්න ප්‍රදිප් ශ්රියන්ත මන්ත්‍රිතුමා කියපු දේට මහා කාලයක් යන්නේ නැහැ. කරන්න. මේ කියන කාලේට පොඩි කාලයක් වුනාට ඇගට ගන්නේ නැහැ ඇගට ගන්නේ නැති නිසා ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා. දැන් ඔන්න කියනවානම් සම්පත් දෙන්නේ නැහැ. සේවකයො නැහැ. එහෙම ප්‍රශ්නයකුත් නැහැ. මට තේරෙන්නේ නැහැ. ඇයි මේවා මගහැරිම කරන්නේ කියන එක තමයි තියෙන ගැටලුව.

**නියෝජ්‍ය නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම ඒ අදාල මන්ත්‍රිතුමා කොට්ඨාශවල මන්ත්‍රිතුමා සම්බන්ධ කරගෙන ව්‍යාපෘති හදන්න සම්පත් ටිකත් අපි ගාව තියෙනවානේ. ඇත්තටම වටිනවා. ඒනිසා ඒ ටික කරලා

ව්‍යාපෘතියක් හදන්න. ඔබතුමිය මේක ඉක්මණට ඉවර කරන්න සභාව මට්ටමින් කරන්න පුළුවන් ටික අපි කරමු.ඉන් එහාට ගිහිල්ලා කරන්න තියෙනවානම් නවත්තලා සභාවෙන් කරන්න පුලුවන් ටික කරමු.

<u>**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, එහෙම නම් මම මෙහෙම කරන්නම් විශේෂයෙන්ම කොමසාරිස්තුමා ඔය පැත්තෙන් මග හැරිම දිගින් දිගටම වෙන නිසා මම අවුරුදු ගණනාවකට පෙර කරපු කාර්යයට මට ආපහු යන්න වෙනවා. ඔබතුමන්ලා සිකුරාදා උදේ 10.00 සිට මාත් එක්ක පැය දෙකක් දාගන්න සභා දවසට පහුවෙනිදා නිවාඩු නොවේනම් වේලාවක් දාගෙන ගන්න ඕනා. පියවර මොකක්ද ඒ පියවරට අදාල බලධාරියා කවුද එකට මහජන නියෝජිතයා සම්බන්ධවෙන්නේ කවුද ඒ ඔක්කොමත් එක්කම මම හදලා දෙන්නම් කාල සටහනක් එක්කම අපි මේ වැඩේ කරමු. නැත්නම් මේ වැඩේ වෙන්නේ නැහැ. කාල සටහනක් එක්කම හදමු. එහෙනම් හෙට දවසේදි 10.00ට මේ මතු වුණ ආයවනා පෙත්සම් පැමිණිලි සභාව හමුවේ තැබිම සම්බන්ධයෙන් අපි කටයුතු කරමු.

ගරු මන්ත්‍රිවරුනි අපේ පිලිප් ගාවින් මත්තෙස් ගරු මන්ත්‍රිතුමා අභාවයට පත්වෙලා තව දින කිහිපයකින් වසරක් ගත වෙනවා සැප්තැම්බර් 4 වෙනිදා රාත්‍රියේ සර්ව රාත්‍රික පිරිත් පිංකම පැවැත්වෙනවා. පසුදින දානමය කටයුතුවලට කොමසාරිස්තුමා ඇතුලු නිලධාරින්ටත් විශේෂ කොට මගේ ගරු මන්ත්‍රිවරුන්ට ආරාධනා කරන්න කිව්වා. සහභාගිවිමට හැකියාවක් තියෙන සියලුදෙනා පිරිත් පිංකමට සහ දානමය කටයුතු වලට සම්බන්ධවෙන්න කියා ඉල්ලා සිටිනවා.

## 04. <u>ප්‍රශ්න</u> -

<u>**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, 2022.06.02 මාසික සභා රැස්විමේදි මහා නගර සභා මන්ත්‍රි තිසර රසාංජන මෙන්ඩිස් මහතා විසින් කල්දි ඇති ප්‍රශ්නවලට අදාලව 2022 ජුලි මස 21 වන මහා සභාවට පිළිතුරු ලබා දි ඇති අතර, එකි පිළිතුරට අදාලව ඉඩම ග්‍රාමයේ පිරිස් මාවතේ පිහිටි බොල්ගොඩ සිරිපුර ජනාවාසටය අදාල අංක 01, අංක 02, අංක 03, අංක 04, අංක 05, අංක 06 යට අදාල ප්‍රශ්නවලට පිළිතුරු වගුවක් සහිතවත් අංක 7ට පිළිතුරු ලෙසත් සභාවට ඉදිරිපත් කරනවා.

**04(02)** 2022.06.02 දින මාසික සභා රැස්වීමේදී කල් තබන ලද මහා නගර සභා මන්ත්‍රී, එම්. තිසර රසාංජන මැන්දිස් මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න

2019 පෙබරවාරි මස 07 වන දින මෙම ගරු සභාවේ මාසික රැස්වීමේදී, ගරු නගරාධිපතිතුමාගේ නිර්දේශය මත මුදල් කමිටුවෙන් අනුමත කර තිබූ පරිදි "සභාව සතු ඉඩම් මුදල් කමිටුවෙන් අනුමත කර තිබූ පරිදි" සභාව සතු ඉඩම් වල වසර ගණනාවක සිට පදිංචිව සිටින පදිංචිකරුවන් වෙත අදාල ඔප්පු ලබාදීමටත්, එසේ ලබාදීමේදී වර්තමාන තක්සේරු අනුව 1 % ක මුදලක් ඉඩම් ලාභින්ගෙන් සභාව වෙත අයකර ගැනීමටත්, මෙම ගරු සභාව අනුමැතීය ලබාදුන් අතර, එම කටයුත්ත කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ වගකීම ගරු නාගරික කොමසාරිස්තුමා වෙත පැවරීමටත් තීරණය කරන ලදී. ඒ අනුව බොල්ගොඩසිරිපුර ජනාවාසයෙත් ඉහත සඳහන් කළ කැඩැස්තර සිතියම්වල සඳහන් බිම් කැබලි අංක අනුපිළිවෙලට අදාළ ඉඩම්වල හිමිකම, මොරටුව නගර සභාව විසින් ලබාදුන් පුද්ගලයින්ට අදාලව පහත දැක්වෙන විස්තර මෙම සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට ගරු කොමසාරිස්තුමාගෙන් ඉල්ලා සිටිමි.

1. බිම් කැබලි අංකය

2. ඉඩමේ ප්‍රමාණය (පර්චස්)

3. හිමිකම පවරා දුන් අයගේ නම හා ලිපිනය

4. සභාව වෙත බිම් කැබලි සඳහා අය කර ගත් මුදල් ප්‍රමාණයන්

5. හිමිකම පවරා දුන් දිනය

6. සභාව විසින් අය කර ගත් මුදල් සඳහා සභාව විසින් නිකුත් කරන ලද කුවිතාන්සි වල අංක සහ දිනයන්

04 (02) 7 එම මුදල් කුමණ බැංකුවක කුමණ බැංකු ගිණුමක් යටතේ තැන්පත් කර ඇති වග
පිළිතුරු - මහජන බැංකුව මොරටුව
සාමාන්‍ය ගිණුමේ ගිණුම් අංකය - 091-1-001-5-2795800

## 05. යෝජනා

05 (01) ගරු නගරාධිපති, ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා විසින් පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.

"නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මඟින් සී වීව් රෙසිඩන්සීස් නමින් මහල් නිවාස සංකිර්ණයක් ඉදිකර ඇති ලුනාව තානායම පිහිටි ඉඩම මොරටුව මහා නගර සභාව සතු වන අතර එම ඉඩම සඳහා නියමිත වන්දි මුදල් ගෙවීම මේ දක්වා සිදුනොකිරිමෙන් මොරටුව මහා නගර සභාවට සහ මොරටුව මහා නගර සභා බල ප්‍රදේශයේ ජනතාවට සිදුව ඇති මූල්‍යමය හානිය හා අයිතිවාසිකම් උල්ලංඝනය සම්බන්ධව මහා නගර සභා ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව විගණනයක් සිදු කරන මෙන් විගණකාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිය යුතු යැයි යෝජනා කරන්නීය."

මහා නගර සභා මන්ත්‍රී, එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, 224 වගන්තිය යටතේ අප විසින් කලින් කල්දෙන කාරණා සම්බන්ධයෙන් විගණනය කිරීම සඳහා විගණකාධිපති බැදි ඉන්නවා. 224 වගන්තියෙන් විගණකාධිපති සඳහා යෝජනාවක් සම්මත කරන්නට ඕනෑ. මේ යෝජනාව සම්මත කිරීමක් කරලා එමඟින් විගණනය කරලා මෙහි නිත්‍ය අයිතිය ලබා ගැනිමේ කටයුත්ත සඳහා මේ කරන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදින්නාදු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙම යෝජනාවේ අන්තර්ගතය ඉතාම පැහැදිලියි. "ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් සී විව් රෙසිඩන්සීස් නමින් මහල් නිවාස සංකිර්ණයක් ඉදිකර ඇති ලුනාව තානායම පිහිටි ඉඩම මොරටුව මහා නගර සභාව සතුවන අතර, එම ඉඩම සඳහා නියමිත වන්දි මුදල ගෙවීම මේ දක්වා සිදු නොකිරිමෙන් මොරටුව මහා නගර සභාවට සහ මොරටුව මහා නගර සභා බල ප්‍රදේශයේ ජනතාවට සිදුව ඇති මූල්‍යමය හානිය හා අයිතිවාසිකම් උල්ලංඝනය සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව විගණනයක් සිදුකරන මෙන් විගණකාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිය යුතුයැයි යෝජනා කරන්නිය". දැන් ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා තමයි යෝජක දැන් මේ කථා කරන කාරණාව පිළිබඳව, දැන් මෙහි එක කොටසක් සම්බන්ධයෙන් තමයි දැන් මේ අපි කථා කරන්නේ. එතකොට සාමාන්‍යයෙන් අපිට යම් ගැටලුවකට වඩාත් යහපත් විසඳුම් ලැබෙන්නේ නැහැ. කොටස් විදියට අරගෙන මෙය කථා කරන එක ඇතුලේ අපිට සංයුක්ත අදහසක් අවශ්‍ය වෙනවා මේ කාරණාව සම්බන්ධයෙන්. මේ යෝජනාව කියවන කොටම මේ යෝජනාව පෙරලා ප්‍රශ්න කිරිමක් කරනවා විශේෂයෙන් යෝජකයා විදියට ඔබතුමාගෙන් වගේම ඔබතුමාගේ පාලනයෙන් මේ යෝජනාව ඇතුලේම මේ ප්‍රශ්න කිරිම තමන්ගේ දිසාවට ඇඟිල්ල හරවන එක වළක්වන්න බැහැ. ඒ නිසා ලුනාව තානායම ඉඩම මේ සභාව සතුව තිබුන පෞරාණික වටිනාකමක් අපිට එකතුකල මේ මොරටුව මහා ජනතාවගේ සම්පතක්. ඒ මොරටුව මහා

ජනතාවගේ සම්පත බලා කියා ගන්න ආරක්ෂා කරගන්න වැඩි දියුණු කරගන්න ජනතාවගේ යහපත උදෙසා තමයි මේ ආයතනය දේශපාලන අධිකාරියකට භාරදෙන්නේ. ඒ දේශපාලන අධිකාරියේ නායකයා ලෙස ඔබව තෝරා පත්කර ගන්නේ. දැන් ඒ ඉඩමට ඇති වෙච්ච තත්ත්වය පිළිබඳව තමයි මේ යෝජනාවෙන් කියන්නේ. ඒ ඉඩම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මඟින් මහල් නිවාස සංකීර්ණයක් ඉදිකර ඇත. දැන් මේ කියන්නේ අපේ ඉඩමක් අපේ තානායම සහිත ඉඩම මේ ආයතනයත් රාජ්‍ය ආයතනයකට සම්බන්ධයි. මම හිතන්නේ නිවාස සංවර්ධන අධිකාරියට සම්බන්ධයි. එතකොට දැන් මේ රාජ්‍ය ආයතන දෙකක්, එකක් මොරටුව මහා නගර සභාව, එකක් නිවාස සංවර්ධන අධිකාරියට අනුබද්ධිත නාගරික සංවර්ධන අධිකාරිය. දැන් මේ රාජ්‍ය ආයතන දෙකක කරන ලද ගණුදෙනුවක් දැන් මේගොල්ලෝ ඇවිල්ලා බලෙන් අපේ ඉඩම අල්ලගෙන නිවාස හැදුවා නෙවෙයි. මේ මෙහි සිදුවෙච්ච පිළිවෙලක් තියෙනවා. දැන් ඒ පිළිවෙල පිළිබඳව යම් මතකයක් තියෙනවා. අදහසක් තියෙනවා. ඒ අදහස ඇතුලේ අඩුපාඩුකම් තියෙන්න පුළුවන්. ඒ නිසා අපි සතු මහජනයා සතු දේපලක් තව බාහිර පාර්ශවයකට ලබා දිමේදී විශේෂයෙන් රාජ්‍ය ආයතනයකට අප විසින් අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග නිතිමය ක්‍රියාමාර්ග අපි අමතක කොට අප වාචික කරුණු මත පදනම් වෙලා මේ ඉඩම දිලා තියෙනවා. අපට පුළුවන්නම් මේ සභාවට ඔබගෙන් අප ප්‍රශ්න කරනවා. දැන් මෙච්චර වටින මහජන දේපලක් ඔබ යටතේ ඔබ පාලනයේ තියෙන දේපලක් අද ඔබ කියනවානම් මෙහි තියෙනවා නියමිත වන්දි මුදල් ගෙවිම. ඒ නියමිත වන්දි මුදල් සඳහන් වෙන්නේ කුමන ලේඛනයේද? අප ඔවුන් සමඟ මේ ගණුදෙනුව සිද්ධ කරන වෙලාවේ ඔවුන්ට අපි අපේ වටිනා ඉඩම දෙන වෙලාවේ මේ නියමිත මුදල් පිළිබඳව කුමන හෝ ගිවිසුමක් කුමන හෝ නෛතික ලියවිල්ලක් එකඟතාවයක් ඇවිත් තියෙනවාද? මම දන්න විදියට නැහැ. මම දන්න විදියට මගේ අවබෝධය තියෙන්නේ මේ රංගන ශාලාව අර්ධ වශයෙන් නිමවා තිබිච්ච අතරමග නතර කොට කොන්ත්‍රාත්කරුවා විසින් යම් ගැටලුවක් හදලා ඔහුට එරෙහිව ක්‍රියාමාර්ග මම හිතන්නේ අදත් අවසාන නැහැ. ඒ නිසා රංගන ශාලාව නතර කරලා තියෙන වැඩ ටික අවසන්කොට නවිකරණය කොට මේ සභාවට භාරදෙන්න තමයි. මේ එකඟතාවය එය වාචික එකඟතාවයක්.

ගරු නගරාධිපතිතුමනි, දැන් මම අහනවා මේ රාජ්‍ය නිලධාරින්ගෙන් දේශපාලන අධිකාරියට අයිති කොටසක් තිබෙනවා. රාජ්‍ය නිලධාරින්ට අයිති කොටසක් තියෙනවා. මේ රාජ්‍ය ආයතන දෙකක මේ රටේ වගකියන ඒ රාජ්‍ය ආයතන දෙක පාලනය කරන ව්‍යුහයන් කිහිපයක් එකක් පොදු ජන එක්සත් පෙරමුණ පාලනය, ඊළඟට යහපාලන පාලනය ඊළඟට මේ පාලනයන් යටතේ හිටපු ඒ ආයතනයට වගකියන අමාත්‍යාංශ එක විටෙක විමල් විරවංශ ඇමතිතුමා තව විටෙක සජිත් ප්‍රේමදාස ඇමතිතුමා. දැන් මේ දිර්ඝ කාලයක් මෙය විටින් විට ප්‍රශ්න කරන කොට ඒ ප්‍රශ්න වලට උත්තර දුන්නේ නගරාධිපතිතුමා. මට මතක හැටියට දිගින් දිගටම කිව්වේ ඒ සාකච්ඡා යමින් තිබෙනවා. අවසාන අදියරට ඇවිල්ලා තියෙනවා. ඒ සියල්ල දැන් අපට ලබාදීමට නියමිතව තිබෙනවා. හැබැයි එහෙම කියපු ඔබ මේ නිවාස පද්ධතිය විවෘත කරනවිට එහි ප්‍රධාන ආරාධිතයෙක්. මේ පීත්ත පටිය කපන්නේ ඔබ. ඒ නිසා මේ මහජන දේපලක් දුන්නේ තව රාජ්‍ය ආයතනයකට. ඉදිකලේ නිවාස. ඒ නිසා මේ බිමේ දුප්පත් මිනිස්සු ඉලක්ක කරලා ගොඩනගන ලද නිවාස නොවෙයි. ඒ නිවාස යමක්කමක් තිබෙන හැකියාවක් තිබෙන යම් මැද පාන්තික පිරිසක් ඉලක්ක කරලා හදපු නිවාස. දැන් තියෙන ප්‍රශ්නය තමයි අපේ මහජනයා සතු දේපලක් යම් ආයතනයක් එක්ක කල ගණුදෙනුවක් කිසිදු නෛතික ලියවිල්ලක් නොමැති වාචික එකඟතාවයක්. මෙය මොනතරම් දුරට මේ රාජ්‍ය ආයතන දෙකකට ගැලපෙද? අනෙක් එක මේ නිවාස ව්‍යාපෘතියම නිවාස බිස්නස් එකක්. මේ එක ගෙයක්වත් නොමිලේ දුන්නේ නැහැ. මේ ගෙවල්වල වටිනාකම මම හිතන්නේ ලක්ෂ 50න් උඩ. ඒ නිසා එක ආයතනයක් තව ආයතනයකට මහා ජනයාගේ දේපලක් දිලා නිවාස බිස්නස් එකක් හදලා දුන්නා. දැන් අයිතිකරුවා විදියට මේ ආයතනයේ පාලනය මෙතෙක් පාලනය කලේ ඔබ ඔබේ කණ්ඩායම දැන් ඔබ කියනවා නියමිත වන්දි මුදල් ගෙවිම මේ දක්වා සිදු නොකිරිමෙන් ඇත්ත ඒ හානිය මේ මොරටුවේ ජනතාවට, ඒ ආවාසිය මේ මොරටුවේ ජනතාවට. ඒ අහිමිවුනේ පෞරාණික වටිනාකමක් සහිත මහා නගර සභාව සතු දේපලක් දැන් කවුද වග කියන්නේ? වග කියන්න ඕනෑ. ඔබට ජනයා දිපු මේ ධූරය මේ පාලනය ජනයාගේ විශ්වාසය ඔබ ඔවුන්ගේ දේපල රකියි යැයි කියන විශ්වාසයෙන්. හැබැයි වාචික එකගතාවයකින් ජනයාගේ දේපලක් දිලා දැන් කියනවා නියමිත වන්දි මුදල් නියමිත වන්දි මුදල කොහෙද තියෙන්නේ. මොන ලේඛනයේද තියෙන්නේ. අපේ ඔලුවේ තියෙන අදහසක් තියෙනවා අපේ රංග ශාලාව හදලා දෙන්න එකඟවුනා. මට මතක හැටියට මිලියන 15ක්. ඒ සාකච්ඡාව ඇතුලේ මම නිවැරදි ද දන්නේ නැහැ. ලක්ෂ 150ක් විතර වැයවෙනවා කියන ඇස්තමේන්තුවක් ඇතුලේ එකඟවුනා.

ගරු නගරාධිපතිතුමනි, දැන් අපිට මෙහි බේරගන්න ප්‍රශ්න ගොඩක් තියෙනවා. මේ නිවාස සංවර්ධන අධිකාරිය රාජ්‍ය ආයතනයක ඒ දේශපාලන අධිකාරිය වගේ මේ නිලධාරින් මේ ආයතනයේ දේශපාලන

අධිකාරිය වගේම මේ නිළධාරින් මේ මොන පනතේද තියෙන්නේ තමන් සතු වටිනා දේපලක් වාචික ප්‍රකාශනයක් ඇතුලේ දෙන්න තව බාහිර පාර්ශවයකට. මම කියන්නේ මූලිකව මුල සිට කලේ වැරැද්දක් ඒ වැරැද්දේ මුදුනට ගිහිල්ලා නියමිත වන්දි මුදල් ගෙව්වේ නැහැ. ඒ මුදල ලබාගැනිම වෙනුවෙන් විගණකාධිපති කියනවානම් පරික්ෂණයක් කරන්න කියලා අපි කියනවා ඒ පරික්ෂණයට යන්න. එහි මුලට ඒ පරික්ෂණය යන්න ඕනැ. එහි ආරම්භයට මේ දේපල හුවමාරු කල ආකාරය පිළිබඳව මේ පරික්ෂණයට ඇතුල් කරගන්න ඕනැ. ඒ නිසා විගණනය සිද්ධ වෙන්න ඕන අපි එකඟයි. හැබැයි සමස්ථ විගණනයක් වෙන්න ඕනැ. මේ තිබෙන්නේ කාටවත් ඇඟිල්ල දික්කරලා චූදිතයින් කරන ප්‍රකාශනයක් නෙමෙයි. මේ තිබෙන්නේ මේ ආයතන වලට මේ රටට අද මේ රටේ ජනයා මුහුණ දෙන ගැටලු වලට බලපාන ලද තීන්දු තිරණවල අවසාන ඵලය මේ තියෙන්නේ. මෙය ලුනාවේ තානායම ඉඩමට වෙන්කරලා වාද විවාද කලාට බොහෝ දේවල් සිද්ධවෙලා තියෙන්නේ එහෙමයි. ඒ නිසා මෙයට වගකියන්න ඕනැ. ඒ ඒ වගකිම් ගත්ත පුද්ගලයන් විතරක්ම නෙමෙයි මේ රාජ්‍ය ආයතනවල ඉන්න මම කියන්නේ මේ අනපනත් නිතිවලට ඉතාම තදින් බැදිලා ඉන්නවා මේ නිලධාරින්. ඒ නිසා ඔවුන්ට මෙහි වගකිමක් තියෙනවා. ඒ නිසා අපි හිතනවා මම තමයි හොඳටම කලේ කියලා. ඔබ කොච්චර කිව්වත් මේ තියෙන්නේ කරපු විදිය තමයි අද පෙරලා ප්‍රශ්න කරන්නේ ඔබ ඔබෙන්. ඒ නිසා ඉතිහාසේ සිද්ධවෙච්ච මේ එක දේපලකට අදාල මේ වරද වඩාත් පැහැදිලි විග්‍රහයකින් තොරව තමන්ගේ පංගුව තමන්ගේ කොටස විතරක් බේරගන්න හදනවානම් තව වරදක් කරනවා. ඒ නිසා අපි මේ යෝජනාවට පක්ෂ වෙන්නේ සමස්ථ විගණනයක් මේ දේපල දීර්ඝ කාලයක් අප සතුයි. පෞද්ගලිකව එක එක්කෙනාට මේ තානායම දුන්නා. එහෙම තමයි මේ දේපල ආවේ. ආයතනයක් විදියට මෙයට වඩාත්ම ඉතාම වටිනාකම් ගොඩක් එකතු කරගන්න තිබ්ච්ච එකක් අපේ අතින් ගිලිහුනා. කාලයක් සුනාමි කඳවුරක් බවට ඒ ඉඩම පත්වුනා. ඉන් අනතුරුව තමයි ඔය ඉඩමේ නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස ටික ඉදිකරන්නේ. ඒ නිසා මෙය ඇතුලේ තියෙනවා විනිවිදභාවයකින් තොර ගණුදෙනුවක්. අන්න ඒ ගණුදෙනුව වඩාත් හොඳින් සිද්ධවෙච්ච නැති එකඟතාවය බිඳ වැටිච්ච එකේ ප්‍රතිඵලය විදියට තමයි අද මම හිතන්නේ මේ එන්නේ මෙය වාචිකව එකඟවෙච්ච එකඟතාවයක්. ඒ එකඟතා බිඳවැටිමක් ඇති. අපිට සාධාරණ සැකයක් නිසා දැන් මේ පරික්ෂණයක් විගණකාධිපතිතුමාගෙන් ඉල්ලන්නේ ගෙවපු නැති මුදල් ගැන. ඒ නිසා අපිට තියෙනවා මේ විනිවිදභාවයකින් තොරව ඉදිකරන ලද නිවාස බිස්නස් එකක්. ඒක මොරටුව මහා නගර සභාව වගේම නිවාස සංවර්ධන අධිකාරියත් විගණනයට ලක්වෙන්න ඕනැ. ඒ නිසා අවසාන මොහොතේ ගෙවලුත් හදලා විවෘතත් කරනකොට මේ ඉඩම දෙන්න එකඟවෙච්ච නගරාධිපති ගිහිල්ලා ඒ වීත්ත පටිය කපනකොට ඒ ජනතාවට විශ්වාසයක් හැදෙනවා ගැටලුවකින් තොරව ඇයි නගරාධිපතිතුමා ඉන්නවා ඒ ස්ථානයේ එකක් ඒ මිනිස්සුන්ගේ විශ්වාසනීයත්වය ලැබුවා. ඒ නිසා මිලදී ගැනිම් කලා. නිවාස ගත්තා. දැන් නගරාධිපති කියනවා ගෙව්වෙ නැහැ අපිට අදින්නේ නැහැ කුණු, අපි ආයි පිඩාවට පත්කරනවා. රාජ්‍ය ආයතන දෙකක වැරදි ගණුදෙනුවක් නිසා අහිංසක මිනිස්සුන්ට ආයි පිඩාවට පත්කරලා තියෙන්නේ. ඒ මිනිස්සුන්ව ආයි සෞඛ්‍ය ගැටලු ඇතිවෙලා තියෙන්නේ ඒ මිනිස්සුන්ට ඒගොල්ලො බාහිර පාර්ශවයකට සල්ලි දිලා කුණු ටික අදිනවා හැමදාම. ඒගොල්ලන්ට ඒක කරන්න බැහැ. ඒ නිසා දැන් මේ ප්‍රධාන වගකිව යුතු ආයතන දෙක එකතුවෙලා ඒ මිනිස්සුන්ව නිදහස් කරන්න ඕනැ. මුලින්ම ඒ අයගේ කසල ටික අදින්න ඕනා. මුලින්ම ඒගොල්ලන්ට වරිපනම් ලබාදෙන ක්‍රමයකට යන්න ඕනැ. පනතට අනුව ඒක කලයුතුයි. ගැටලු අදාල නැහැ එයට. ඒ නිසා ඔය ගැටලුව ලිහාගන්නනම් ඒ පිඩාවට පත්වෙලා ඉන්න මිනිස්සුන්ව මුලින්ම එතනින් බේරන්න ඕනැ. ඊලගට මේ ආයතන දෙකත් එක්ක මේ ගැටලුව විසඳගන්න ඕනැ. විගණකාධිපතිවරයා හරහා මූලික පරික්ෂණයක් කරන්න ඕනැ. ආරම්භයේ සිට එසේ කොට මෙය නිවැරදි කරන්න කියලා ඉල්ලිම කරන්නේ. ඒ නිසා අපිට විවේචනය තියෙන්නේ මේ ආයතන දිගටම ආයතන පාලනය කරපු කණ්ඩායම් විසින් දුරක් දිගක් නොහිතා අර බෝක්කු උඩ ගණුදෙනු කරන අපි කියන වචනයෙන් කිව්වොත් රස්තියාදුකාරයෝ මේ දේපල තමන්ගේ අම්මා අප්පාගේ බූදලය ලෙස සලකලා හිතෙන හිතෙන විදියට මේවා ගණුදෙනු කිරිමේ විපාකය මේ තියෙන්නේ. ඒ නිසා මේ නියමිත මුදල කියන එක දාන කොටම මම කල්පනා කලා මේ නියමිත මුදල කොහෙද තියෙන්නේ. මම කැමතියි ඔබෙන් අහගන්න මේ නියමිත මුදල මොකක්ද කෝ ඒ ලේඛන. ගිවිසුමක් තියේද? මම හිතන්නෙත් මම දන්න විදියටම තමයි ඔබත් දන්නේ කියලා. වාචික එකඟතාවය මම හැමදාම මෙය ප්‍රශ්න කලා. මම විටින් විට ප්‍රශ්න කලා. මොකද මම දන්න හින්දා එකඟතාවයක් තිබුනේ ගොඩනැගිල්ල හදලා ඉවර කරලා නවිකරණය කරලා දෙන්න එකඟවෙච්ච නිසා විරවංශ ඇමතිතුමා ඉන්න විට සාකච්ඡා කරනවා මම ඔබෙන් ප්‍රශ්න කරනවා සජිත් ඇමතිතුමා ඉන්නකොට මම ඔබෙන් ප්‍රශ්න කරනවා ඔබ එවිට උත්තර දෙනවා. ඒ නිසා තෙරපුම මගේ පැත්තෙන් දිගටම ආවේ. දැන් ඔයගොල්ලෝ ගෙවල් හදාගෙන යනවානම් ඒගොල්ලො සාධාරණය ඉෂ්ඨ කරන්න ඕනැ. ඒ එකඟතාවයට අනුව මෙය හදලා ඉවර කරලා දෙන්න ඕනැ. හැබැයි ඒ

තෙරපුම ඇතුලේ බලපෑම ඇතුලෙවත් ඒක සිද්ධ කරගන්න බැරිවුනා. ඒ බැරිවෙච්ච හේතුව ඔබ කියලා මට තියෙන විවේචනය. ඒ නිසා අද ඒ විගණනය අනිවාර්යෙන් ආරම්භයේ සිටම මේ ආයතනය පාලනය කරපු ඒ පාලනයන්ටත් මේවා දෙන්න ඉඩ සාදපු නිළධාරින්ටත් මේ සියල්ලම මේ නීතිය ඇතුලේ හිරවෙයි. විපක්ෂය නිසා අපිටත් එහෙම වෙයි. අපි විශ්වාස කරනවා ඒ ගන්න තින්දු තිරණවලට ඒ අවස්ථාවල එවට විරුද්ධ වුනා. හැබැයි අපි මොනතරම් විරුද්ධ වුනත් ඔවුන්ගේ තියෙන බලය පාවිච්චි කරලා මේවා කලා. ඒ නිසා දැන් හදනවානම් කමක් නැහැ. ඔබට ස්තුතිවන්ත වෙනවා. මේ කථා කරන්න හරි මේ අවස්ථාව ලබාදෙන්න මේ යෝජනාව දාපු එක ගැන. මොකද මේ පිළිබඳව වඩාත් නිවැරදි අදහසක් මොරටුවේ ජනතාවට දෙන්න ඕනෑ. ඔවුන්ගේ දේපල වලට වෙන හානිය වින්නැහිය පිළිබඳව කියන්න ඕනෑ. ඒ නිසා තමයි මේ සංවාදය ඇතුලේ අපි මේ විවාදයට සම්බන්ධ වුනේ. ඒ නිසා මේ යෝජනාවට සමස්ථ යෝජනාව සමස්ථ විගණනයකට ලක්කරනවා නම් ලක්කර විසඳුමක් දෙනවානම් උත්තරයක් අපි එකඟයි. එහෙම නැත්නම් තමන්ගේ භාගේ විතරක් තමන්ගේ කොටස විතරක් තමන්ගේ පංගුව විතරක්නම් බේරගන්න උත්සාහ කරන්නේ අපිට එකඟවෙන්නත් බැහැ වගේම විරුද්ධ වෙන්නත් බැහැ. විරුද්ධ වෙන්න බැරි ඒ කොටස ඇතුලෙත් තියෙන්නේ මේ දේපලට හිමි දේ නැවත ගන්න හින්දා ආසයි බයයි නැහැ කවුරුහරි වරදක් කරාට ඒ වරදෙන් තමන් වැහෙන්න හැදුවත් මෙයින් කියන්නේ ආයි මේ දේපලට හිමි මුදල ලබා ගැනිම කියන චේතනාව මුල්කරගෙන නම් ඒ මුදල ලබා ගැනිම වළක්වාගන්න අපි සුදානම් නැහැ. ඒ නිසා විරුද්ධ වෙන්නේ නැහැ ඒ අර්ථයෙන්. නමුත් ඔබ ඔබේ වගකිම පැහැර හැරපු අවස්ථාවක් මෙතරම් වටින දේපලක් කිසිදු ගිවිසුමකින් තොරව බාහිර පාර්ශවයත් අතට වාචික වුවමනාවට දීම වරදක් ලෙස දකින එක වරදක් ලෙස දැකලා අන්න එතන සිට නිවැරදි කරගන්න උත්සාහා කරමු.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

